# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

# ඇගයීම් වාර්තාව

# 85 - ගෘහ ආර්ථික විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

## ඇගයීම් වාර්තාව

# 85 - ගෘහ ආර්ථික විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ගෘහ ආර්ථික විද්‍යාව

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය
ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)
හා අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

ගෘහ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මගින් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2019 ජනවාරි 22
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | මනෝමි සෙනෙවිරත්න<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **විෂය සම්බන්ධීකරණය** | : | බුද්ධිකා පෙරේරා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| | | ඩී.ආර්.එන්.කේ ගමගේ<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ආර්. මුන්ඩිගල<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය(විශ්‍රාමික)<br>සී.එල්. විද්‍යාලංකාර<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික) |
| **සැකසුම් කමිටුව** | : | ඩී.ඩී.සී. රොඩ්රිගෝ<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/කළු/මියුසියස් ක.විද්‍යාලය |
| | | එන්.එච්.ඒ.එන්.සී. ගීතානි<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>ව/ගිරි අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල ම.ම.වි |
| | | ඊ.ඩබ්.එම්.සී.එම් ඒකනායක<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>ශාන්ත ජෝශප් බා.ම.වි |
| | | එස්.එම්.යූ.කේ.එම් සංගක්කාර<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>මොළගොඩ ජයපාල ම.වි<br>මොළගොඩ |
| **පරිගණක පිටපත සැකසුම** | : | පී. මධුශානී මණ්ඩලවත්ත<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| | | ආර්.ජී මධුෂා දිල්රුක්ෂි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | එස්.එච්.සමන් කුමාර<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

# ඇතුළත පිටු

පිටු අංකය

I **කොටස**

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I පත්‍රය සඳහා සාධනය 8

1.3.2 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9

1.3.3 II පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9

1.3.4 II පත්‍රය සඳහා සාධනය 10

II **කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I පත්‍රයේ ව්‍යුහය 11

2.1.2 I පත්‍රය 12

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16

2.1.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව 17

2.1.5 I පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 19

2.1.6 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II පත්‍රයේ ව්‍යුහය 22

2.2.2 II පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

2.2.3 II පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 38

III **කොටස**

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 39

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 40

3.3 විදුහල්පතිවරුන් සඳහා උපදෙස් 41

## I කොටස

### 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

#### 1.1 විෂය අභිමතාර්ථ

- ★ ගෘහ කළමනාකරණයට අයත් විවිධ ක්ෂේත්‍රයන්ට අදාල ප්‍රායෝගික සහ ගැටලු විසඳීමේ ශිල්පීය ක්‍රම උපයෝගී කර ගැනීමේ හැකියාව මගින් සිසුන්ගේ ආත්ම විශ්වාසය හා ආත්මාභිමානය ගොඩනැගීම.

- ★ යහපත් පෝෂණාමය පුරුදු ඇති කිරීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, වර්ධනය කිරීම තුළින් පෝෂණාමය යහ පැවැත්ම පිළිබඳව වගකීම පිළිගැනීමට උනන්දු කරවීම.

- ★ ගෘහ ආර්ථික විද්‍යා විෂයය හා බැඳි විවිධ වෘත්තීමය අවස්ථා පිළිබඳ දැනුවත් බවක් ලබා දීම.

- ★ යහපත් ආකල්ප සහ සාරධර්ම වර්ධනය කිරීම මගින් පුද්ගල සහ සමාජ සංවර්ධනය ඇති කිරීම.

ඉහත අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා සමාජ සබඳතා සමෝධානය කෙරෙන නිපුණතා පෙළක් වර්ධනය කර ගැනීමට සහාය වීම ගෘහ ආර්ථික විද්‍යා විෂයයෙන් අපේක්ෂා කෙරේ.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 30925 | 73 | 30998 |
| දෙමළ | 7194 | 134 | 7328 |
| ඉංග්‍රීසි | 0 | 0 | 0 |
| එකතුව | 38119 | 207 | 38326 |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 2486 | 6.52 | 1 | 0.48 | 2487 | 6.49 |
| B | 4739 | 12.43 | 15 | 7.25 | 4754 | 12.4 |
| C | 12098 | 31.74 | 54 | 26.09 | 12152 | 31.71 |
| S | 12788 | 33.55 | 74 | 35.75 | 12862 | 33.56 |
| W | 6008 | 15.76 | 63 | 30.43 | 6071 | 15.84 |
| **එකතුව** | **38119** | **100** | **207** | **100** | **38326** | **100** |

වගුව 2

## 1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | **3181** | **194** | **6.10** | **378** | **11.88** | **905** | **28.45** | **1020** | **32.07** | **2497** | **78.50** | **684** | **21.50** |
| 2. ගම්පහ | **4520** | **359** | **7.94** | **554** | **12.26** | **1384** | **30.62** | **1511** | **33.43** | **3808** | **84.25** | **712** | **15.75** |
| 3. කළුතර | **2756** | **152** | **5.52** | **314** | **11.39** | **828** | **30.04** | **960** | **34.83** | **2254** | **81.79** | **502** | **18.21** |
| 4. මහනුවර | **3001** | **215** | **7.16** | **431** | **14.36** | **998** | **33.26** | **943** | **31.42** | **2587** | **86.20** | **414** | **13.80** |
| 5. මාතලේ | **1121** | **73** | **6.51** | **113** | **10.08** | **391** | **34.88** | **361** | **32.20** | **938** | **83.68** | **183** | **16.32** |
| 6. නුවරඑළිය | **1616** | **51** | **3.16** | **141** | **8.73** | **460** | **28.47** | **658** | **40.72** | **1310** | **81.06** | **306** | **18.94** |
| 7. ගාල්ල | **2586** | **250** | **9.67** | **366** | **14.15** | **889** | **34.38** | **800** | **30.94** | **2305** | **89.13** | **281** | **10.87** |
| 8. මාතර | **1455** | **198** | **13.61** | **290** | **19.93** | **492** | **33.81** | **359** | **24.67** | **1339** | **92.03** | **116** | **7.97** |
| 9. හම්බන්තොට | **944** | **60** | **6.36** | **105** | **11.12** | **335** | **35.49** | **330** | **34.96** | **830** | **87.92** | **114** | **12.08** |
| 10. යාපනය | **1054** | **25** | **2.37** | **84** | **7.97** | **270** | **25.62** | **394** | **37.38** | **773** | **73.34** | **281** | **26.66** |
| 11. කිලිනොච්චි | **206** | **6** | **2.91** | **21** | **10.19** | **62** | **30.10** | **74** | **35.92** | **163** | **79.13** | **43** | **20.87** |
| 12. මන්නාරම | **227** | **11** | **4.85** | **43** | **18.94** | **85** | **37.44** | **72** | **31.72** | **211** | **92.95** | **16** | **7.05** |
| 13. වව්නියාව | **248** | **1** | **0.40** | **16** | **6.45** | **83** | **33.47** | **98** | **39.52** | **198** | **79.84** | **50** | **20.16** |
| 14. මුලතිව් | **94** | **3** | **3.19** | **8** | **8.51** | **28** | **29.79** | **29** | **30.85** | **141** | **150.00** | **26** | **27.66** |
| 15. මඩකලපුව | **626** | **9** | **1.44** | **43** | **6.87** | **177** | **28.27** | **258** | **41.21** | **487** | **77.80** | **139** | **22.20** |
| 16. අම්පාර | **739** | **14** | **1.89** | **77** | **10.42** | **227** | **30.72** | **284** | **38.43** | **602** | **81.46** | **137** | **18.54** |
| 17. ත්‍රිකුණාමලය | **548** | **19** | **3.47** | **50** | **9.12** | **173** | **31.57** | **187** | **34.12** | **429** | **78.28** | **119** | **21.72** |
| 18. කුරුණෑගල | **3467** | **303** | **8.74** | **519** | **14.97** | **1156** | **33.34** | **1123** | **32.39** | **3101** | **89.44** | **366** | **10.56** |
| 19. පුත්තලම | **1543** | **49** | **3.18** | **141** | **9.14** | **481** | **31.17** | **617** | **39.99** | **1288** | **83.47** | **255** | **16.53** |
| 20. අනුරාධපුරය | **1431** | **61** | **4.26** | **161** | **11.25** | **452** | **31.59** | **504** | **35.22** | **1178** | **82.32** | **253** | **17.68** |
| 21. පොළොන්නරුව | **571** | **27** | **4.73** | **59** | **10.33** | **203** | **35.55** | **189** | **33.10** | **478** | **83.71** | **93** | **16.29** |
| 22. බදුල්ල | **1616** | **114** | **7.05** | **225** | **13.92** | **501** | **31.00** | **542** | **33.54** | **1382** | **85.52** | **234** | **14.48** |
| 23. මොනරාගල | **607** | **18** | **2.97** | **58** | **9.56** | **188** | **30.97** | **232** | **38.22** | **496** | **81.71** | **111** | **18.29** |
| 24. රත්නපුරය | **2070** | **113** | **5.46** | **257** | **12.42** | **698** | **33.72** | **678** | **32.75** | **1746** | **84.35** | **324** | **15.65** |
| 25. කෑගල්ල | **1892** | **161** | **8.51** | **285** | **15.06** | **632** | **33.40** | **565** | **29.86** | **1643** | **86.84** | **249** | **13.16** |
| සමස්ත දිවයින | **38119** | **2486** | **6.52** | **4739** | **12.43** | **12098** | **31.74** | **12788** | **33.55** | **32184** | **84.43** | **6008** | **15.76** |

වගුව 3

## 1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1003 | 62 | 6.18 | 102 | 10.17 | 272 | 27.12 | 339 | 33.8 | 775 | 77.27 | 228 | 22.73 |
| 2. හෝමාගම | 633 | 46 | 7.27 | 114 | 18.01 | 195 | 30.81 | 191 | 30.17 | 546 | 86.26 | 87 | 13.74 |
| 3.ශ්‍රී ජයවර්ධනපුර | 811 | 41 | 5.06 | 102 | 12.58 | 230 | 28.36 | 257 | 31.69 | 630 | 77.68 | 181 | 22.32 |
| 4. පිළියන්දල | 734 | 45 | 6.13 | 60 | 8.17 | 208 | 28.34 | 233 | 31.74 | 546 | 74.39 | 188 | 25.61 |
| 5. ගම්පහ | 1128 | 112 | 9.93 | 141 | 12.5 | 342 | 30.32 | 369 | 32.71 | 964 | 85.46 | 164 | 14.54 |
| 6 මිනුවන්ගොඩ | 1036 | 117 | 11.29 | 139 | 13.42 | 333 | 32.14 | 331 | 31.95 | 920 | 88.8 | 116 | 11.2 |
| 7. මීගමුව | 1236 | 61 | 4.94 | 142 | 11.49 | 349 | 28.24 | 437 | 35.36 | 989 | 80.02 | 247 | 19.98 |
| 8. කැලණිය | 1120 | 69 | 6.16 | 132 | 11.79 | 360 | 32.14 | 374 | 33.39 | 935 | 83.48 | 185 | 16.52 |
| 9. කළුතර | 1320 | 38 | 2.88 | 114 | 8.64 | 384 | 29.09 | 501 | 37.95 | 1037 | 78.56 | 283 | 21.44 |
| 10. මතුගම | 660 | 44 | 6.67 | 101 | 15.3 | 220 | 33.33 | 199 | 30.15 | 564 | 85.45 | 96 | 14.55 |
| 11. හොරණ | 776 | 70 | 9.02 | 99 | 12.76 | 224 | 28.87 | 260 | 33.51 | 653 | 84.15 | 123 | 15.85 |
| 12. මහනුවර | 790 | 84 | 10.63 | 119 | 15.06 | 266 | 33.67 | 207 | 26.2 | 676 | 85.57 | 114 | 14.43 |
| 13. දෙනුවර | 291 | 19 | 6.53 | 56 | 19.24 | 96 | 32.99 | 93 | 31.96 | 264 | 90.72 | 27 | 9.28 |
| 14. ගම්පොල | 652 | 30 | 4.6 | 64 | 9.82 | 214 | 32.82 | 228 | 34.97 | 536 | 82.21 | 116 | 17.79 |
| 15. තෙල්දෙණිය | 329 | 26 | 7.9 | 51 | 15.5 | 103 | 31.31 | 103 | 31.31 | 283 | 86.02 | 46 | 13.98 |
| 16. වත්තේගම | 531 | 32 | 6.03 | 82 | 15.44 | 163 | 30.7 | 182 | 34.27 | 459 | 86.44 | 72 | 13.56 |
| 17. කටුගස්තොට | 408 | 24 | 5.88 | 59 | 14.46 | 156 | 38.24 | 130 | 31.86 | 369 | 90.44 | 39 | 9.56 |
| 18. මාතලේ | 629 | 45 | 7.15 | 61 | 9.7 | 217 | 34.5 | 202 | 32.11 | 525 | 83.47 | 104 | 16.53 |
| 19. ගලේවෙල | 346 | 20 | 5.78 | 33 | 9.54 | 122 | 35.26 | 117 | 33.82 | 292 | 84.39 | 54 | 15.61 |
| 20. නාඋල | 71 | 4 | 5.63 | 9 | 12.68 | 29 | 40.85 | 19 | 26.76 | 61 | 85.92 | 10 | 14.08 |
| 21. විල්ගමුව | 75 | 4 | 5.33 | 10 | 13.33 | 23 | 30.67 | 23 | 30.67 | 60 | 80 | 15 | 20 |
| 22. නුවරඑළිය | 511 | 5 | 0.98 | 34 | 6.65 | 128 | 25.05 | 236 | 46.18 | 403 | 78.86 | 108 | 21.14 |
| 23. කොත්මලේ | 186 | 5 | 2.69 | 18 | 9.68 | 52 | 27.96 | 76 | 40.86 | 151 | 81.18 | 35 | 18.82 |
| 24. හැටන් | 440 | 16 | 3.64 | 31 | 7.05 | 138 | 31.36 | 174 | 39.55 | 359 | 81.59 | 81 | 18.41 |
| 25. වලපනේ | 241 | 10 | 4.15 | 29 | 12.03 | 65 | 26.97 | 97 | 40.25 | 201 | 83.4 | 40 | 16.6 |
| 26. හඟුරන්කෙත | 238 | 15 | 6.3 | 29 | 12.18 | 77 | 32.35 | 75 | 31.51 | 196 | 82.35 | 42 | 17.65 |
| 27. ගාල්ල | 1105 | 114 | 10.32 | 142 | 12.85 | 401 | 36.29 | 318 | 28.78 | 975 | 88.24 | 130 | 11.76 |
| 28. ඇල්පිටිය | 635 | 69 | 10.87 | 101 | 15.91 | 191 | 30.08 | 206 | 32.44 | 567 | 89.29 | 68 | 10.71 |
| 29. අම්බලන්ගොඩ | 479 | 26 | 5.43 | 52 | 10.86 | 156 | 32.57 | 184 | 38.41 | 418 | 87.27 | 61 | 12.73 |
| 30. උඩුගම | 367 | 41 | 11.17 | 71 | 19.35 | 141 | 38.42 | 92 | 25.07 | 345 | 94.01 | 22 | 5.99 |
| 31. මාතර | 582 | 59 | 10.14 | 101 | 17.35 | 203 | 34.88 | 164 | 28.18 | 527 | 90.55 | 55 | 9.45 |
| 32. අකුරැස්ස | 331 | 74 | 22.36 | 82 | 24.77 | 89 | 26.89 | 64 | 19.34 | 309 | 93.35 | 22 | 6.65 |
| 33.මුලටියන-හක්මණ | 278 | 40 | 14.39 | 66 | 23.74 | 100 | 35.97 | 57 | 20.5 | 263 | 94.6 | 15 | 5.4 |
| 34. මොරවක-දෙනියාය | 264 | 25 | 9.47 | 41 | 15.53 | 100 | 37.88 | 74 | 28.03 | 240 | 90.91 | 24 | 9.09 |
| 35. තංගල්ල | 286 | 17 | 5.94 | 36 | 12.59 | 107 | 37.41 | 98 | 34.27 | 258 | 90.21 | 28 | 9.79 |
| 36. හම්බන්තොට | 381 | 18 | 4.72 | 32 | 8.4 | 132 | 34.65 | 142 | 37.27 | 324 | 85.04 | 57 | 14.96 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 37. වලස්මුල්ල | 277 | 25 | 9.03 | 37 | 13.36 | 96 | 34.66 | 90 | 32.49 | 248 | 89.53 | 29 | 10.47 |
| 38. යාපනය | 383 | 10 | 2.61 | 32 | 8.36 | 102 | 26.63 | 142 | 37.08 | 286 | 74.67 | 97 | 25.33 |
| 39. දූපත් | 52 | 2 | 3.85 | 4 | 7.69 | 18 | 34.62 | 17 | 32.69 | 41 | 78.85 | 11 | 21.15 |
| 40. තෙන්මාරච්චි | 122 | 3 | 2.46 | 14 | 11.48 | 27 | 22.13 | 49 | 40.16 | 93 | 76.23 | 29 | 23.77 |
| 41. වලිකාමන් | 398 | 10 | 2.51 | 24 | 6.03 | 96 | 24.12 | 151 | 37.94 | 281 | 70.6 | 117 | 29.4 |
| 42. වඩමරච්චි | 99 | 0 | 0 | 10 | 10.1 | 27 | 27.27 | 35 | 35.35 | 72 | 72.73 | 27 | 27.27 |
| 43. කිලිනොච්චි | 206 | 6 | 2.91 | 21 | 10.19 | 62 | 30.1 | 74 | 35.92 | 163 | 79.13 | 43 | 20.87 |
| 44. මන්නාරම | 210 | 11 | 5.24 | 43 | 20.48 | 80 | 38.1 | 62 | 29.52 | 196 | 93.33 | 14 | 6.67 |
| 45. මඩු | 17 | 0 | 0 | 0 | 0 | 5 | 29.41 | 10 | 58.82 | 15 | 88.24 | 2 | 11.76 |
| 46. වව්නියාව | 211 | 1 | 0.47 | 12 | 5.69 | 67 | 31.75 | 87 | 41.23 | 167 | 79.15 | 44 | 20.85 |
| 47. වව්නියාව උතුර | 37 | 0 | 0 | 4 | 10.81 | 16 | 43.24 | 11 | 29.73 | 31 | 83.78 | 6 | 16.22 |
| 48. මුලතිව් | 86 | 3 | 3.49 | 6 | 6.98 | 27 | 31.4 | 24 | 27.91 | 60 | 69.77 | 26 | 30.23 |
| 49. තුනුක්කායි | 8 | 0 | 0 | 2 | 25 | 1 | 12.5 | 5 | 62.5 | 8 1 | 0 | 0 | 0 |
| 50. මඩකලපුව | 165 | 2 | 1.21 | 18 | 10.91 | 45 | 27.27 | 64 | 38.79 | 129 | 78.18 | 36 | 21.82 |
| 51. කල්කුඩා | 188 | 0 | 0 | 5 | 2.66 | 49 | 26.06 | 87 | 46.28 | 141 | 75 | 47 | 25 |
| 52. පදිරිප්පු | 121 | 6 | 4.96 | 8 | 6.61 | 34 | 28.1 | 46 | 38.02 | 94 | 77.69 | 27 | 22.31 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 114 | 1 | 0.88 | 12 | 10.53 | 46 | 40.35 | 43 | 37.72 | 102 | 89.47 | 12 | 10.53 |
| 54 මඩකලපුව (බටහිර) | 38 | 0 | 0 | 0 | 0 | 3 | 7.89 | 18 | 47.37 | 21 | 55.26 | 17 | 44.74 |
| 55. අම්පාර | 362 | 6 | 1.66 | 32 | 8.84 | 113 | 31.22 | 136 | 37.57 | 287 | 79.28 | 75 | 20.72 |
| 56. කල්මුනේ | 95 | 2 | 2.11 | 4 | 4.21 | 24 | 25.26 | 43 | 45.26 | 73 | 76.84 | 22 | 23.16 |
| 57. සමන්තුරෙයි | 36 | 0 | 0 | 5 | 13.89 | 10 | 27.78 | 18 | 50 | 33 | 91.67 | 3 | 8.33 |
| 58. මහඔය | 64 | 1 | 1.56 | 2 | 3.13 | 16 | 25 | 30 | 46.88 | 49 | 76.56 | 15 | 23.44 |
| 59. දෙහිඅත්තකණ්ඩිය | 139 | 2 | 1.44 | 18 | 12.95 | 45 | 32.37 | 53 | 38.13 | 118 | 84.89 | 21 | 15.11 |
| 60. අක්කරෙයිපත්තුව | 43 | 3 | 6.98 | 16 | 37.21 | 19 | 44.19 | 4 | 9.3 | 42 | 97.67 | 1 | 2.33 |
| 61. තිරුක්කෝවිල් | 00 | 0 | 0.00 | 0 | 0.00 | 00 | 00.00 | 00 | 00.00 | 00 | 00.00 | 00 | 00.00 |
| 62. ත්‍රිකුණාමලය | 97 | 4 | 4.12 | 7 | 7.22 | 36 | 37.11 | 36 | 37.11 | 83 | 85.57 | 14 | 14.43 |
| 63. මුතූර් | 97 | 5 | 5.15 | 9 | 9.28 | 26 | 26.8 | 42 | 43.3 | 82 | 84.54 | 15 | 15.46 |
| 64. කන්තලේ | 62 | 3 | 4.84 | 6 | 9.68 | 20 | 32.26 | 24 | 38.71 | 53 | 85.48 | 9 | 14.52 |
| 65. කින්නියා | 195 | 3 | 1.54 | 17 | 8.72 | 56 | 28.72 | 60 | 30.77 | 136 | 69.74 | 59 | 30.26 |
| 66. ත්‍රිකුණාමලය (උතුර) | 97 | 4 | 4.12 | 11 | 11.34 | 35 | 36.08 | 25 | 25.77 | 75 | 77.32 | 22 | 22.68 |
| 67. කුරුණෑගල | 784 | 105 | 13.39 | 127 | 16.2 | 240 | 30.61 | 234 | 29.85 | 706 | 90.05 | 78 | 9.95 |
| 68. කුලියාපිටිය | 665 | 66 | 9.92 | 111 | 16.69 | 221 | 33.23 | 203 | 30.53 | 601 | 90.38 | 64 | 9.62 |
| 69. නිකවැරටිය | 529 | 51 | 9.64 | 96 | 18.15 | 173 | 32.7 | 165 | 31.19 | 485 | 91.68 | 44 | 8.32 |
| 70. මහව | 492 | 28 | 5.69 | 65 | 13.21 | 178 | 36.18 | 162 | 32.93 | 433 | 88.01 | 59 | 11.99 |
| 71. ගිරිඋල්ල | 583 | 27 | 4.63 | 57 | 9.78 | 203 | 34.82 | 217 | 37.22 | 504 | 86.45 | 79 | 13.55 |
| 72. ඉබ්බාගමුව | 414 | 26 | 6.28 | 63 | 15.22 | 141 | 34.06 | 142 | 34.3 | 372 | 89.86 | 42 | 10.14 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 73. පුත්තලම | 550 | 10 | 1.82 | 33 | 6 | 148 | 26.91 | 252 | 45.82 | 443 | 80.55 | 107 | 19.45 |
| 74. හලාවත | 993 | 39 | 3.93 | 108 | 10.88 | 333 | 33.53 | 365 | 36.76 | 845 | 85.1 | 148 | 14.9 |
| 75. අනුරාධපුරය | 432 | 8 | 1.85 | 49 | 11.34 | 117 | 27.08 | 168 | 38.89 | 342 | 79.17 | 90 | 20.83 |
| 76. තඹුත්තේගම | 233 | 11 | 4.72 | 24 | 10.3 | 89 | 38.2 | 72 | 30.9 | 196 | 84.12 | 37 | 15.88 |
| 77. කැකිරාව | 393 | 26 | 6.62 | 42 | 10.69 | 114 | 29.01 | 140 | 35.62 | 322 | 81.93 | 71 | 18.07 |
| 78. ගලෙන්බිඳුනුවැව | 191 | 11 | 5.76 | 22 | 11.52 | 68 | 35.6 | 61 | 31.94 | 162 | 84.82 | 29 | 15.18 |
| 79. කැබිතිගොල්ලෑව | 182 | 5 | 2.75 | 24 | 13.19 | 64 | 35.16 | 63 | 34.62 | 156 | 85.71 | 26 | 14.29 |
| 80. පොළොන්නරුව | 110 | 6 | 5.45 | 8 | 7.27 | 31 | 28.18 | 39 | 35.45 | 84 | 76.36 | 26 | 23.64 |
| 81. හිඟුරක්ගොඩ | 258 | 14 | 5.43 | 36 | 13.95 | 100 | 38.76 | 80 | 31.01 | 230 | 89.15 | 28 | 10.85 |
| 82. දිඹුලාගල | 203 | 7 | 3.45 | 15 | 7.39 | 72 | 35.47 | 70 | 34.48 | 164 | 80.79 | 39 | 19.21 |
| 83. බදුල්ල | 474 | 40 | 8.44 | 54 | 11.39 | 154 | 32.49 | 159 | 33.54 | 407 | 85.86 | 67 | 14.14 |
| 84. බණ්ඩාරවෙල | 424 | 26 | 6.13 | 55 | 12.97 | 107 | 25.24 | 153 | 36.08 | 341 | 80.42 | 83 | 19.58 |
| 85. මහියංගනය | 167 | 10 | 5.99 | 26 | 15.57 | 55 | 32.93 | 55 | 32.93 | 146 | 87.43 | 21 | 12.57 |
| 86. වැලිමඩ | 383 | 30 | 7.83 | 62 | 16.19 | 125 | 32.64 | 128 | 33.42 | 345 | 90.08 | 38 | 9.92 |
| 87. පස්සර | 70 | 6 | 8.57 | 12 | 17.14 | 24 | 34.29 | 19 | 27.14 | 61 | 87.14 | 9 | 12.86 |
| 88. වියළුව | 98 | 2 | 2.04 | 16 | 16.33 | 36 | 36.73 | 28 | 28.57 | 82 | 83.67 | 16 | 16.33 |
| 89. මොනරාගල | 199 | 7 | 3.52 | 21 | 10.55 | 61 | 30.65 | 82 | 41.21 | 171 | 85.93 | 28 | 14.07 |
| 90. වැල්ලවාය | 268 | 5 | 1.87 | 25 | 9.33 | 79 | 29.48 | 97 | 36.19 | 206 | 76.87 | 62 | 23.13 |
| 91. බිබිල | 140 | 6 | 4.29 | 12 | 8.57 | 48 | 34.29 | 53 | 37.86 | 119 | 85 | 21 | 15 |
| 92. රත්නපුර | 905 | 52 | 5.75 | 102 | 11.27 | 304 | 33.59 | 287 | 31.71 | 745 | 82.32 | 160 | 17.68 |
| 93. බළන්ගොඩ | 363 | 22 | 6.06 | 53 | 14.6 | 129 | 35.54 | 107 | 29.48 | 311 | 85.67 | 52 | 14.33 |
| 94. නිවිතිගල | 349 | 21 | 6.02 | 49 | 14.04 | 111 | 31.81 | 125 | 35.82 | 306 | 87.68 | 43 | 12.32 |
| 95. ඇඹිලිපිටිය | 453 | 18 | 3.97 | 53 | 11.7 | 154 | 34 | 159 | 35.1 | 384 | 84.77 | 69 | 15.23 |
| 96. කෑගල්ල | 637 | 72 | 11.3 | 103 | 16.17 | 219 | 34.38 | 171 | 26.84 | 565 | 88.7 | 72 | 11.3 |
| 97. මාවනැල්ල | 557 | 32 | 5.75 | 70 | 12.57 | 181 | 32.5 | 175 | 31.42 | 458 | 82.23 | 99 | 17.77 |
| 98. දෙහිඕවිට | 698 | 57 | 8.17 | 112 | 16.05 | 232 | 33.24 | 219 | 31.38 | 620 | 88.83 | 78 | 11.17 |
| සමස්ත දිවයින | 38119 | 2486 | 6.52 | 4739 | 12.43 | 12098 | 31.74 | 1278 | 8 33.55 | 32111 | 84.23 | 600 | 8 15.76 |

වගුව 4

### 1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 16 | 0.04 | 38326 | 100.00 |
| 81-90 | 381 | 0.99 | 38310 | 99.96 |
| 71-80 | 2214 | 5.78 | 37929 | 98.96 |
| 61-70 | 5011 | 13.07 | 35715 | 93.19 |
| 51-60 | 8784 | 22.92 | 30704 | 80.11 |
| 41-50 | 8420 | 21.92 | 21920 | 57.19 |
| 31-40 | 7872 | 20.54 | 13500 | 35.22 |
| 21-30 | 4027 | 10.51 | 5628 | 14.68 |
| 11-20 | 1426 | 3.72 | 1601 | 4.18 |
| 01-10 | 174 | 0.45 | 175 | 0.46 |
| 00-00 | 1 | 0.00 | 1 | 0.00 |

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : (31 - 40 පන්ති ප්‍රාන්තරය ගතහොත්)

මෙම විෂයය සඳහා 31 - 40 ලකුණු ලබා ඇති සංඛ්‍යාව 7872 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 20.54%කි.

ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 13500 වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 35.22% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/OL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 11 ප්‍රශ්නයටය.එහි ප්‍රතිශතය 78% කි.එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 34 වන ප්‍රශ්නයටය එහි ප්‍රතිශතය 18% කි.

1.3.2 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




**ප්‍රස්තාරය 2** (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඊට 99% පිළිතුරු සපයා ඇත.දෙවන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 34% කි.

1.3.3. II පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




**ප්‍රස්තාරය 3** (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 01 වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 කි. මෙම ප්‍රස්තාරයට අනුව 76 - 100 % ප්‍රාන්තරයේ එනම් 16 - 20 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 14% කි. 51 - 75% ප්‍රාන්තරයේ එනම් 11 - 15 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 48% කි. 26 - 50% ප්‍රාන්තරයේ එනම් 06 - 10 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 31% කි. 0 - 25% ප්‍රාන්තරයේ එනම් 0 - 5 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 6% කි.

### 1.3.4 II පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී. ඉහත ප්‍රස්ථාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයකින් දක්වා ඇත.

උදා: 1 ප්‍රශ්නයේ VII කොටසේ පහසුතාව 83 % ක් වන අතර, VIII කොටසෙහි පහසුතාව 20 % කි.

## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 . I පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 01කි. මුළු ලකුණු 40කි.

★ මෙම ප්‍රශ්න පත්‍රය වරණ හතරක් සහිත බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තේරීම අපේක්ෂා කෙරේ

★ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

ගෘහ ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය සකස් වී ඇත්තේ සිසුන්ට නිපුණතා 13කට අදාළ ඉගෙනුම් අත්දැකීම් ලබාදීම අරමුණු කරගෙනය.

නිපුණතා 1 සහ 2 ගෘහ කළමනාකරණය ක්ෂේත්‍රයට අදාළව ද
නිපුණතා 3 - 9 දක්වා ආහාර හා පෝෂණය ක්ෂේත්‍රයට අදාළව ද
නිපුණතා 10 සහ 11 රෙදිපිළි තාක්ෂණය ක්ෂේත්‍රයට අදාළව ද
නිපුණතා 12 සහ 13 ළමා සංවර්ධනය ක්ෂේත්‍රයට අදාළව ද
ඉදිරිපත් කර ඇත.

ගෘහ ආර්ථික විද්‍යාව 1 ප්‍රශ්න පත්‍රය සකස් කිරීමේදී එක් එක් ක්ෂේත්‍රයට අදාළ නිපුණතා සංඛ්‍යාව පදනම් කර ගනිමින් ප්‍රශ්න සංඛ්‍යාව තීරණය කර ඇත.

| ක්ෂේත්‍රය | ප්‍රශ්න සංඛ්‍යාව | |
|---|---|---|
| ආහාර හා පෝෂණය | 17 | (1 - 17) |
| ළමා සංවර්ධනය | 10 | (18 - 27) |
| රෙදිපිළි තාක්ෂණය | 08 | (28 - 35) |
| ගෘහ කළමනාකරණය | 05 | (36 - 40) |

## 2.1.2 I පත්‍රය

**1.** ග්ලූකෝස් අණු දෙකක් සංයෝජනය වී සෑදෙනුයේ,
(1) මෝල්ටෝස් ය. (2) සුක්රෝස් ය. (3) ලැක්ටෝස් ය. (4) ඇමයිලෝස් ය.

**2.** පලතුරුවල අඩංගු කාබෝහයිඩ්‍රේට දෙකකි,
(1) සුක්රෝස් සහ මෝල්ටෝස්. (2) ෆ්රුක්ටෝස් සහ ග්ලූකෝස්.
(3) ග්ලූකෝස් සහ මෝල්ටෝස්. (4) ෆ්රුක්ටෝස් සහ ගැලැක්ටෝස්.

**3.** තන්තුමය ආහාරවල ප්‍රධාන වශයෙන් අඩංගු කාබෝහයිඩ්‍රේටය වනුයේ,
(1) සෙලියුලෝස් ය. (2) පිෂ්ටය ය. (3) පෙක්ටින් ය. (4) ඩෙක්ස්ට්‍රින් ය.

**4.** ධාන්‍යවල බහුලව අඩංගුවන පෝෂක දෙකකි,
(1) පිෂ්ටය සහ විටමින් $B_1$. (2) යකඩ සහ විටමින් E.
(3) කැල්සියම් සහ විටමින් A. (4) පිෂ්ටය සහ විටමින් K.

**5.** මේදය අඩංගු පලතුරකි,
(1) බෙලි. (2) දොඩම්. (3) දිවුල්. (4) අලිගැටපේර.

**6.** සන්තෘප්ත මේද අම්ල දෙකකි,
(1) මිරිස්ටික් අම්ලය සහ ඇරකිඩොනික් අම්ලය.
(2) බියුටිරික් අම්ලය සහ ඔලෙයික් අම්ලය.
(3) ලිනොලෙයික් අම්ලය සහ ලිනොලෙනික් අම්ලය.
(4) පාමිටික් අම්ලය සහ ස්ටියරික් අම්ලය.

**7.** විටමින් $B_3$ හි රසායනික නාමය වනුයේ,
(1) නිකොටිනික් අම්ලය ය. (2) ඇස්කෝබික් අම්ලය ය.
(3) පැන්ටොතෙනික් අම්ලය ය. (4) ෆෝලික් අම්ලය ය.

**8.** මූත්‍ර සමග සිරුරෙන් බැහැර වන විටමිනයකි,
(1) විටමින් A. (2) විටමින් C. (3) විටමින් D. (4) විටමින් E.

**9.** නිරක්තය ඇතිවීම කෙරෙහි බලපාන පෝෂණ ඌනතා දෙකකි,
(1) යකඩ සහ විටමින් K. (2) යකඩ සහ කැල්සියම්.
(3) යකඩ සහ ෆෝලික් අම්ලය. (4) යකඩ සහ අයඩින්.

**10.** 'X' නමැති පෝෂකය මගින් ඉටුවන කෘත්‍ය කිහිපයක් පහත දැක්වේ.
- ශක්තිය සැපයීම
- ප්‍රතිශක්තිය ඇති කිරීම
- හෝර්මෝන නිපදවීමට අවශ්‍ය වීම
- රුධිරය නිෂ්පාදනයට අවශ්‍ය වීම

'X' වනුයේ,
(1) කාබෝහයිඩ්‍රේට ය. (2) මේදය ය. (3) විටමින් A ය. (4) ප්‍රෝටීන් ය.

**11.** වඩාත් ම පෝෂ්‍යදායී උදේ ආහාරවේල මින් කුමක් ද?
(1) ඉදිආප්ප, මාළු කරිය, පොල්මැල්ලුම, කෙසෙල් ගෙඩියක්
(2) පාන්, බටර්, ජෑම්, ගස්ලබු කැබැල්ලක්
(3) පිට්ටු, කිරිහොදි, ලුණුමිරිස්, අඹ කැබැල්ලක්
(4) ආප්ප, සෝයාමීට් ව්‍යංජනය, සීනිසම්බල, පේර ගෙඩියක්

**12.** ප්‍රෝටීන් පරිපූරක ආහාරයක් **නො වනුයේ** මින් කුමක් ද?
(1) මුං කිරිබත් (2) තෝසෙ (3) මුං කැවුම් (4) හැලප

**13.** ආහාර සකස් කිරීමේ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙළ වනුයේ,
(1) පිරිසිදු කිරීම, කැපීම, සේදීම, කුළුබඩු යෙදීම සහ පිසීමයි.
(2) කැපීම, පිරිසිදු කිරීම, සේදීම, කුළුබඩු යෙදීම සහ පිසීමයි.
(3) සේදීම, පිරිසිදු කිරීම, කැපීම, කුළුබඩු යෙදීම සහ පිසීමයි.
(4) පිරිසිදු කිරීම, සේදීම, කැපීම, කුළුබඩු යෙදීම සහ පිසීමයි.

**14.** ජෙලටිනීකරණය සිදුවන්නේ මින් කුමන අවස්ථාවේ දී ද?
(1) කේක් බේක් කිරීමේ දී (2) බතල තැම්බීමේ දී
(3) පාන් පෙත්තක් කර කිරීමේ දී (4) මාළු ස්ටූ කිරීමේ දී

**15.** ග්‍රහණිය තුළ සිදුවන ජීරණ ක්‍රියාවක් වන්නේ මින් කුමක් ද?
(1) ප්‍රෝටීන → පෙප්ටෝන (2) සුක්රෝස් → ග්ලූකෝස් සහ ෆ්රැක්ටෝස්
(3) ඩයිපෙප්ටයිඩ → ඇමයිනෝ අම්ල (4) පිෂ්ටය → මෝල්ටෝස්

**16.** කාබොහයිඩ්‍රේට ජීරණක එන්සයිම පමණක් ඇතුළත් කාණ්ඩය වනුයේ මින් කුමක් ද?
(1) බේටමය ඇමයිලේස්, ලයිපේස් (2) මෝල්ටේස්, සුක්‍රේස්
(3) ලැක්ටේස්, ලයිපේස් (4) සුක්‍රේස්, පෙප්ටිඩේස්

**17.** බැක්ටීරියා වර්ධනයට වඩාත් හිතකර උපස්තරයක් වනුයේ,
(1) තෙල් ය. (2) කිරි ය. (3) ජලය ය. (4) පලතුරු යුෂ ය.

**18.** යොවුන්විය තුළ ශීඝ්‍ර කායික වර්ධනයක් සිදු වේ. යොවුන්වියේ පිරිමි දරුවකුගේ වර්ධන නැග්ම පෙන්වන වයස් පරාසය සාමාන්‍යයෙන්,
(1) අවුරුදු 10 - 12 ය. (2) අවුරුදු 12 - 14 ය. (3) අවුරුදු 14 - 16 ය. (4) අවුරුදු 16 - 18 ය.

**19.** ටෙස්ටොස්ටෙරෝන් හෝර්මෝනය ස්‍රාවය වනුයේ,
(1) පිටියුටරි ග්‍රන්ථියෙනි. (2) අධිවෘක්ක ග්‍රන්ථියෙනි. (3) වෘෂණ මගිනි. (4) පුරස්ථ ග්‍රන්ථි මගිනි.

**20.** පරිණත ඩිම්බයක් සංසේචනය වනුයේ,
(1) ෆැලෝපීය නාලයේ ඩිම්බකෝෂයට ආසන්න කොටස තුළ ය.
(2) ෆැලෝපීය නාලයේ ගර්භාෂයට ආසන්න කොටස තුළ ය.
(3) ෆැලෝපීය නාලයේ මැද කොටස තුළ ය.
(4) ගර්භාෂය තුළ ය.

**21.** පහත දැක්වෙනුයේ පූර්ව ප්‍රසව සංවර්ධනය හා සම්බන්ධව සිසුවියක විසින් ලියන ලද සටහනකින් උපුටා ගත් වැකි කිහිපයකි. මින් නිවැරදි වැකිය තෝරන්න.
(1) කලල අවධිය ලෙස හඳුන්වනුයේ මාස 0-3 දක්වා කාල සීමාව ය.
(2) අධිරෝපණයෙන් පසුව සංසේචිත ඩිම්බයෙහි සෛල විභාජනය සිදු වේ.
(3) පූර්ව ප්‍රසව අවධිය සති 40 කි.
(4) පූර්ව ප්‍රසව අවධිය තුළ මවගේ බර වැඩිවීම, මුල් මාස තුන තුළ දී වැඩි ය.

**22.** ගර්භිණී අවධියේ අවදානම් සාධකයකි,
(1) ඔක්කාරය. (2) මල බද්ධය. (3) දියවැඩියාව. (4) පාද ඉදිමුම.

**23.** මාතෘ සායනයකට පැමිණි මුල් දිනයේ දී පමණක් කරනු ලබන පරීක්ෂණයකි/පරීක්ෂාවකි,
(1) මවගේ බර මැනීම. (2) මවගේ උස මැනීම. (3) රුධිර පීඩනය මැනීම. (4) මූත්‍ර පරීක්ෂණය.

**24.** ශ්‍රී ලංකාවේ අඩු බර උපතක් ලෙස හඳුන්වනුයේ දරුවාගේ උපත් බර,
(1) කිලෝ ග්‍රෑම් 1.5 ට වඩා අඩු වීම ය. (2) කිලෝ ග්‍රෑම් 2.0 ට වඩා අඩු වීම ය.
(3) කිලෝ ග්‍රෑම් 2.5 ට වඩා අඩු වීම ය. (4) කිලෝ ග්‍රෑම් 3.0 ට වඩා අඩු වීම ය.

**25.** නවජ දරුවා ලෙස හඳුන්වනුයේ,

(1) උපතේ සිට මුල් දින දෙක තුළ දරුවා ය.
(2) උපතේ සිට මුල් සති දෙක තුළ දරුවා ය.
(3) උපතේ සිට මුල් සති හතර තුළ දරුවා ය.
(4) උපතේ සිට මුල් මාස දෙක තුළ දරුවා ය.

**26.** ළදරුවකුට මාස හයක් වන විට අතිරේක ආහාරවලට හුරු කිරීමේ දී පළමුවෙන් ම දිය යුත්තේ,

(1) පලතුරු යුෂ ය. (2) සහල් කැඳ ය. (3) එළවළු සුප් ය. (4) ත්‍රිපෝෂ ය.

**27.** ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට අනුව ළදරුවකුට මාස නවය සම්පූර්ණවත් ම දිය යුතු එන්නත වනුයේ,

(1) පෝලියෝ මුඛ එන්නත ය. (2) ජැපනීස් එන්සෙෆලයිටිස් (JE) එන්නත ය.
(3) සරම්ප එන්නත ය. (4) BCG එන්නත ය.

**28.** විවෘත පැතලි මූට්ටුවක් මැසීමේ දී,

(1) මූට්ටුවට හසු වූ රෙදි දෙපොට එක් පැත්තකට හරවා නිමාවක් දිය යුතු ය.
(2) මූට්ටුවට හසු වූ රෙදි දෙපොට දෙපසට හරවා නිමාවක් දිය යුතු ය.
(3) මූට්ටුවෙහි රෙදි දෙපොටින් එකක් අඩක් කපා අනෙක ඒ මත නවා මැසිය යුතු ය.
(4) මූට්ටුව නොපෙනෙන සේ රෙදි දෙපොට අනෙක් පස හරවා මැසිය යුතු ය.

**29.** නූල ඉඳිකටුවෙහි වාර කිහිපයක් පටලවා, ඉඳිකටුව ඇද, මැස්ම අවශ්‍ය ස්ථානයට ගෙන මසනුයේ,

(1) බුලියන් මැස්ම ය. (2) දිගකොට මැස්ම ය. (3) ප්‍රංශ ගැට මැස්ම ය. (4) සැටින් මැස්ම ය.

**30.** කපු කෙඳි හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) පිළිස්සීමේ දී හිසකෙස් පිළිස්සෙන ගඳක් නිකුත් වේ.
(2) දිගින් වැඩි ම ස්වාභාවික කෙඳි විශේෂය වේ.
(3) ඉක්මනින් ජලය උරා ගනියි.
(4) මැදීමේ දී අඩු උෂ්ණත්වයක් භාවිත කළ යුතු ය.

**31.** කෘත්‍රිම කෙඳි කාණ්ඩයට අයත් පොලිමයිඩ කෙන්දකි,

(1) ටෙරිලින්. (2) ඕර්ලෝන්. (3) රෙයෝන්. (4) නයිලෝන්.

**32.** උපාංග නිර්මාණය සඳහා අවශ්‍ය වන මෙවලම් දෙකක් වන්නේ,

(1) මිනුම් පටිය සහ එම්බ්‍රොයිඩරි රාමුව ය. (2) මහන යන්ත්‍රය සහ දුඹුරු කඩදාසි ය.
(3) දැතිරෝදය සහ කෝඩ් ය. (4) සන්නාලි හුණු සහ බොත්තම් ය.

**33.** ඇඳුම් නිර්මාණයේ දී සිසුන් විසින් අනුගමනය කරන ලද පියවර කිහිපයක් පහත දැක්වේ. මින් නිවැරදි පියවර කුමක් ද?

(1) පතරොමෙහි නිර්මාණ රේඛා සහ මැසීමේ රේඛා (දක්කු රේඛා) එකම වර්ණයකින් දැක්වීම
(2) පතරොමෙහි දිගත් රේඛාව, රෙද්දෙහි බලවාටියට සමාන්තරව තැබීම
(3) පතරොමෙහි කුඩා කොටස් පළමුව රෙද්ද මත අතුරා, ඉන් පසුව විශාල කොටස් ඇතිරීම
(4) රෙද්ද මත පතරොම අතුරා දක්කු රේඛා සටහන් කර කොටස් කපා වෙන් කිරීම

**34.** ළමා ගවුමක කඳ කොටස මැසීමේ නිවැරදි අනුපිළිවෙළ වනුයේ,

(1) උරහිස, විවරය, ආර, අංශය සහ කර මැසීම ය.
(2) ආර, උරහිස, විවරය, කර සහ අංශය මැසීම ය.
(3) උරහිස, කර, විවරය, අංශය සහ ආර මැසීම ය.
(4) ආර, විවරය, උරහිස, අංශය සහ කර මැසීම ය.

**35.** ළමා ගවුම හා සම්බන්ධව සිසු සටහනකින් උපුටා ගත් වැකි කිහිපයක් පහත දැක්වේ. මින් නිවැරදි වනුයේ කුමක් ද?

(1) එම්බ්‍රොයිඩරි මගින් ඉදිරිපස කඳ විසිතුරු කළ යුත්තේ, කඳ කොටස මැසීමෙන් පසුව ය.
(2) විවරය පියවීම සඳහා හක් සහ මුද්‍ර වඩාත් යෝග්‍ය වේ.
(3) හැඩ පෝරුවක් යෙදීමෙන් මනා කර හැඩයක් ලබා ගත හැකි ය.
(4) විවරය මැසීමේ දී එහි වම් පස, දකුණු පස මත සිටින සේ මැසිය යුතු ය.

**36.** නිවෙස් කිහිපයක දක්නට ලැබුණු ලක්ෂණ සමහරක් පහත දැක්වේ. මින් යෝග්‍ය **නො වන** ලක්ෂණය කුමක් ද?
(1) ජනේලවලට ඉහළින් වා කවුළු තිබීම
(2) නිදන කාමරයට යාබදව නාන කාමරය හා වැසිකිළිය තිබීම
(3) මුළුතැන්ගෙයට දොර දෙකක් තිබීම
(4) නිදන කාමරයක ජනේල සඳහා පාරදෘශ්‍ය වීදුරු යොදා තිබීම

**37.** කලා මූලිකාංගයකි,
(1) තුලනය. (2) එකඟත්වය. (3) වයනය. (4) අවධාරණය.

**38.** මින් සිසිල් වර්ණ කාණ්ඩය වනුයේ,
(1) කොළ සහ නිල් ය. (2) කහ සහ කොළ ය. (3) දම් සහ කහ ය. (4) නිල් සහ තැඹිලි ය.

**39.** මෝස්තර මූලධර්මයක් වන රිද්මය පෙන්නුම් කරන අවස්ථාවකි,
(1) නිවසක ඇති තරප්පු පේළිය. (2) සිවිලිමෙහි මැදට සවිකර ඇති විදුලි පහන.
(3) කෑම මේසය මැද ඇති මල් සැකසුම. (4) විසිත්ත කාමරයෙහි තබා ඇති විවිධ උපාංග.

**40.** විස්තෘත පවුලක ජීවත්වීමේ වාසියකි,
(1) තීරණ ගැනීම පහසුවීම. (2) පෞද්ගලිකත්වය ආරක්ෂා වීම.
(3) ශ්‍රම විභජනය මැනවින් සිදුවීම. (4) මුදල් පාලනය පහසු වීම.

**2.1.3** I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 01 | 21. | 03 |
| 02. | 02 | 22. | 03 |
| 03. | 01 | 23. | 02 |
| 04. | 01 | 24. | 03 |
| 05. | 04 | 25. | 03 |
| 06. | 04 | 26. | 02 |
| 07. | 01 | 27. | 02 |
| 08. | 02 | 28. | 02 |
| 09. | 03 | 29. | 01 |
| 10. | 04 | 30. | 03 |
| 11. | 01 | 31. | 04 |
| 12. | 04 | 32. | 01 |
| 13. | 04 | 33. | 02 |
| 14. | 02 | 34. | 02 |
| 15. | 04 | 35. | 03 |
| 16. | 02 | 36. | 04 |
| 17. | 02 | 37. | 03 |
| 18. | 03 | 38. | 01 |
| 19. | 03 | 39. | 01 |
| 20. | 01 | 40. | 03 |

නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.

2.1.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව




ප්‍රස්ථාරය 05

| ප්‍රශ්න අංකය | විෂය ක්ෂේත්‍ර | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|---|
| 1 - 17 | ආහාර හා පෝෂණය | 11 (78%) | 14 (19%) |
| 18 - 27 | ළමා සංවර්ධනය | 22 (75%) | 20,23 (27%) |
| 28 - 35 | රෙදිපිළි තාක්ෂණය | 30 (70%) | 34 (18%) |
| 36 - 40 | ගෘහ කළමනාකරණය | 37 (73%) | 38 (38%) |




ප්‍රස්ථාරය 06

I පත්‍රයට අදාළ ක්ෂේත්‍ර 4 න් වැඩිම පහසුතාවයක් දක්වා ඇත්තේ රෙදිපිළි තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව සැකසී ඇති ප්‍රශ්න බව පැහැදිලි වේ.එහි පහසුතාව 54% කි. ආහාර හා පෝෂණය ප්‍රශ්නවල පහසුතාව 48%කි. ළමා සංවර්ධනය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්නවල පහසුතාව 45% කි. ගෘහ කළමනාකරණය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්නවල පහසුතාව 40% ක් ද වේ.

2.1..5 I පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | ප්‍රතිචාර නොදැක්වූ |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | |
| 1 | 1 | **50.1%** | 34.6% | 9.7% | 5.5% | 0.1 |
| 2 | 2 | 13.1% | **52.6%** | 20.0% | 14.2% | 0.1 |
| 3 | 1 | **69.0%** | 17.4% | 11.9% | 1.7% | - |
| 4 | 1 | **59.3%** | 9.9% | 12.8% | 17.7% | 0.3 |
| 5 | 4 | 20.2% | 5.4% | 7.6% | **66.6%** | 0.2 |
| 6 | 4 | 13.4% | 22.4% | 27.1% | **36.8%** | 0.3 |
| 7 | 1 | **29.2%** | 22.4% | 21.2% | 27.1% | 0.1 |
| 8 | 2 | 7.2% | **35.3%** | 29.2% | 27.9% | 0.4 |
| 9 | 3 | 19.7% | 23.4% | **24.4%** | 32.4% | 0.1 |
| 10 | 4 | 19.2% | 10.1% | 11.9% | **58.6%** | 0.2 |
| 11 | 1 | **78.0%** | 7.0% | 13.0% | 2.0% | - |
| 12 | 4 | 4.4% | 58.8% | 14.5% | **22.2%** | 0.1 |
| 13 | 4 | 5.8% | 2.4% | 23.2% | **68.5%** | 0.1 |
| 14 | 2 | 40.5% | **18.7%** | 11.7% | 28.9% | 0.2 |
| 15 | 4 | 22.8% | 24.7% | 22.3% | **30.0%** | 0.2 |
| 16 | 2 | 42.5% | **39.9%** | 10.8% | 6.7% | 0.1 |
| 17 | 2 | 3.3% | **76.8%** | 13.6% | 6.3% | -- |
| 18 | 3 | 5.2% | 18.5% | **54.5%** | 21.6% | 0.2 |
| 19 | 3 | 40.7% | 11.1% | **42.5%** | 5.6% | 0.1 |
| 20 | 1 | **26.7%** | 26.7% | 25.2% | 21.3% | 0.1 |
| 21 | 3 | 21.5% | 26.1% | **34.0%** | 18.3% | 0.1 |
| 22 | 3 | 3.9% | 15.2% | **75.5%** | 5.0% | 0.4 |
| 23 | 2 | 14.8% | **26.6%** | 21.1% | 37.5% | - |
| 24 | 3 | 23.6% | 10.1% | 56.9% | **9.3%** | 0.1 |
| 25 | 3 | 15.2% | 21.0% | 49.7% | 14.0% | 0.1 |
| 26 | 2 | 27.7% | **42.7%** | 11.8% | 17.8% | - |
| 27 | 2 | 20.4% | **40.6%** | 19.2% | 19.7% | 0.1 |
| 28 | 2 | 14.3% | **23.4%** | 26.7% | 35.4% | 0.2 |
| 29 | 1 | **35.9%** | 9.3% | 46.5% | 8.3% | - |
| 30 | 3 | 9.6% | 11.5% | **70.0%** | 8.9% | - |
| 31 | 4 | 9.1% | 13.6% | 20.1% | **57.1%** | 0.1 |
| 32 | 1 | **54.4%** | 14.9% | 20.8% | 9.8% | 0.1 |
| 33 | 2 | 6.8% | **22.4%** | 9.8% | 60.9% | 0.1 |
| 34 | 2 | 23.7% | **17.7%** | 45.1% | 13.4% | 0.1 |
| 35 | 3 | 17.8% | 21.5% | **39.4%** | 21.2% | 0.1 |
| 36 | 4 | 11.4% | 12.3% | 32.6% | **43.7%** | - |
| 37 | 3 | 15.6% | 6.2% | **72.9%** | 5.4% | - |
| 38 | 1 | **38.3%** | 45.0% | 9.8% | 6.8% | 0.1 |
| 39 | 1 | **48.6%** | 10.0% | 11.6% | 29.6% | 0.2 |
| 40 | 3 | 14.8% | 14.3% | **66.1%** | 4.7% | 0.1 |

★ එක් එක් ප්‍රශ්නයට අදාළව නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

2.1.6. I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

- ★ පළමුවන ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න අංක 7, 9, 12, 14 ,15, 20 ,23 ,28, 33 සහ 34 යන ප්‍රශ්න සඳහා නිවැරදි වරණය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 35% ට අඩු ප්‍රතිශතයකි.

- ★ 7 වන ප්‍රශ්නයට නිවැරදි ප්‍රතිචාරය වන 1 වරණය තෝරා ගෙන ඇත්තේ 29% කි. මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත්තේ විටමින් B සංකීර්ණයෙහි එක් එක් විටමිනයෙහි රසායනික නාමය පිළබඳව නිවැරදි අවබෝධයක් නොමැතිවීමයි. පෙළපොත පරිශීලනය සහ විටමින් වර්ගවල රසායනික නාම චාට් සටහන් මගින් නිතර දර්ශනය වීමට සැලැස්වීමෙන් මෙම අඩුපාඩුව මඟ හරවා ගත හැකිය.

- ★ 9 වෙනි ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන 3 වරණය තෝරා ගෙන ඇත්තේ 24% කි. නමුත් 32% ක් 4 වෙනි වරණය නිවැරදි වරණය ලෙස තෝරාගෙන තිබුණි. ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කර නොගැනීමත් ක්‍රියාකාරීත්වයේ දී එකට බැඳී පවතින පෝෂක පිළිබඳව මනා දැනුවත් බවක් නොමැති වීමත් මෙයට හේතු විය හැකිය.ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මේ පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් වේ.

- ★ 14 වෙනි ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වන 2 වරණය තෝරා ගෙන ඇත්තේ 19% කි. 40% ක් නිවැරදි පිළිතුර ලෙස 1 වරණය තෝරා ගෙන තිබුණි. පිසීමේ ක්‍රමවලදී පෝෂක වල සිදු වන රසායනික හා භෞතික විපර්යාස පිළිබඳ මනා අවබෝධයක් නොමැති බව පැහැදිලි වේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් මෙම දැනුම ලබා දිය යුතුය.

- ★ 15 වෙනි ප්‍රශ්නය ආහාර ජීර්ණ ක්‍රියාවලිය හා සම්බන්ධ වූවකි.නිවැරදි පිළිතුර තෝරා ගෙන ඇත්තේ 30% කි. වැඩිම ශිෂ්‍ය ප්‍රතිචාර දක්වා ඇති වරණයද එයයි. ආහාර ජීර්ණ පද්ධතියෙහි එකිනෙක කොටස තුළ සිදුවන ජීර්ණ ක්‍රියාව පිළිබඳ දැනුම අල්ප බව පැහැදිලි වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ හා සම්බන්ධ දැනුම පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා දීම අවශ්‍ය වේ.

- ★ 20 වෙනි ප්‍රශ්නය සඳහා නිවැරදි ප්‍රතිචාරය වන 1 වෙනි වරණය තෝරා ගෙන ඇත්තේ 27% කි.ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ කොටස් සහ ඒවායින් කෙරෙන කාර්යයන් පිළිබඳව නිශ්චිත අවබෝධයක් නොමැති බව පැහැදිලි වේ. රූප සටහන් භාවිතය, තාක්ෂණික මෙවලම් භාවිතය මගින් දැනුවත් කිරීම වැදගත් වේ.

- ★ 23 වෙනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර ලෙස තෝරා ගෙන ඇත්තේ 27% ක් පමණි. 38%ක් නිවැරදි පිළිතුරු ලෙස තෝරා ගෙන ඇත්තේ 4 වෙනි වරණයයි. මාතෘ සායනයක කෙරෙන පරීක්ෂණ පිළිබඳ ඊට සම්බන්ධ සම්පත් දායකයින් මගින් දැනුවත් කිරීම සහ මාතෘ සායනයක් නැරඹීමට අවස්ථාව සැලසීම මගින් ඒ පිළිබඳ දැනුම සහ අවබෝධය ලබා දීමට හැකි වේ.

- ★ 28 වෙනි ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන්නේ 2 වරණයයි. එය තෝරා ගෙන ඇත්තේ 23 % ක් වැනි සුළු ප්‍රතිශතයකි. මැසීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික දැනුම අඩු බව මෙම ප්‍රතිචාරවලින් පැහැදිලි වේ. එබැවින් මැහුම් ක්‍රම පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් දැනුම ලබා දීම අත්‍යවශ්‍ය වේ.

- ★ 33 වෙනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වන්නේ 2 වරණයයි. ඒ සඳහා ප්‍රතිචාර දක්වා ඇත්තේ 22% කි. ඇඳුම් නිර්මාණය පිළිබඳව ප්‍රායෝගික දැනුම නොමැතිබව මෙහිදී ද පැහැදිලි වේ. විෂය නිර්දේශිත පතරොම් ආශ්‍රිත ඇඳුම් නිර්මාණය පියවරින් පියවර ආදර්ශනය කිරීමෙන් අවශ්‍ය දැනුවත් බව ලබා දිය හැකිය.

* 34 වෙනි ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරාගෙන ඇත්තේ 18% ක් වැනි ඉතා සුළු ප්‍රතිශතයකි. මෙයට ද හේතුව විෂය නිර්දේශයේ ඇතුලත් මැහුම් ක්‍රම සහ ඇඳුම් නිර්මාණය පිළිබඳ ප්‍රායෝගික දැනුම සහ අත්දැකීම් නොමැති වීමයි.නිර්දේශිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල සිසුන් නිරත කරවීම අත්‍යවශ්‍ය වේ.

* ප්‍රශ්න අංක 1 - 17 දක්වා ආහාර හා පෝෂණය විෂය ක්ෂේත්‍රය යටතේ ප්‍රශ්න ඉදිරිපත් කර තිබුණි.එම ප්‍රශ්න 17 න් ප්‍රශ්න 5 ක් සඳහා 35% ට අඩු ප්‍රතිශතයක් ලබා ගෙන තිබුණි.

* ළමා සංවර්ධනය විෂය ක්ෂේත්‍රය යටතේ ප්‍රශ්න අංක 18 - 27 දක්වා ප්‍රශ්න 10 ක් ඉදිරිපත් කර තිබුණි. ඉන් ප්‍රශ්න 3 ක් සඳහා 35% ට අඩු ප්‍රතිශතයක් ලබා ගෙන තිබුණි.

* ප්‍රශ්න අංක 28 -35 දක්වා ප්‍රශ්න 8 ක් රෙදිපිළි තාක්ෂණ ක්ෂේත්‍රය ට අදාළව ඉදිරිපත් කර තිබුණි. ඉන් ප්‍රශ්න 3 ක් සඳහා 35% ට අඩු ප්‍රතිචාර දක්වා තිබුණි.

* ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ගෘහ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ව ප්‍රශ්න 5 ක් ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා සියළුම අයදුම්කරුවන් 35% ට වැඩි ප්‍රතිශතයක් පෙන්නුම් කර තිබුණි.

* පහසුතා දර්ශකය ට අනුව ප්‍රශ්න අංක 1, 2, 3, 4, 5, 10, 11, 13, 16, 17, 18, 19, 22, 24, 25, 26, 27, 30, 31, 32, 36, 37,39, 40, යන ප්‍රශ්න සඳහා 40% - 78% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇත. ඉන් සනාථ වනුයේ සිසුන් අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වී ඇති බවය.

* ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ දෘෂ්‍යාධාර භාවිතය මගින්, ගෘහ ආර්ථික විද්‍යාව විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රායෝගික දැනුම මෙන්ම න්‍යායාත්මක දැනුම ද වර්ධනය කළ හැකිය. පෙළ පොත පරිශීලනයට සිසුන් යොමු කිරීම මගින්ද, විෂය දැනුම පෝෂණය කළ හැකිය. එමගින් විෂය සාධන මට්ටම ඉහළ නැංවීමට හැකිවේ.

## 2. 2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* ප්‍රශ්න 7කින් යුක්ත ය. කාලය පැය 02 කි.

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ කොටස් 10කින් සමන්විත වේ. එක් කොටසකට ලකුණු 02ක් බැගින් මුළු ලකුණු 20 කි.

* සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6 න් 4 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40 කි.

  II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 40 = 60

  II පත්‍රයේ අවසන් ලකුණු = 60

**2.2.2** II පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1, 4.2, හා 4.3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත. |

**1 ප්‍රශ්නය**

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මව, පියා, යොවුන්වියේ පසුවන දියණියකගෙන් හා පුතකුගෙන් සමන්විත වූ පවුලකි. ඔවුහු යහපත් පවුල් ජීවිතයක් ගත කරති. පියා රැකියාවක නිරතවන අතර මව ගෘහිය වැඩ කටයුතුවල නියැළෙන්නී ය. සකසුරුවම්කම මෙම පවුලේ අය තුළ දක්නට ඇත. ඔවුහු තම ආහාර පරිභෝජන රටාව පිළිබඳව විශේෂ අවධානයකින් කටයුතු කරති. දරුවන්ගේ හා සැමියාගේ අවශ්‍යතා තමා විසින් ම ඉටු කර දීමට මව උත්සුක වන්නී ය.

(i) තම පවුල සඳහා ආහාර සකස් කිරීමේ දී මව විසින් සැලකිල්ලට ගන්නා කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(ii) යොවුන් වියේ පසුවන පිරිමි දරුවාගේ විශේෂ පෝෂණ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.
(iii) රැකියාවට යන සැමියාට රැගෙන යාමට දිවා ආහාර වේල සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(iv) මෙම දරුවන් අනුගමනය කරන හොඳ ආහාර පුරුදු **හතරක්** දක්වන්න.
(v) මෙම පවුල් පරිසරය යහපත් එකක් වීමට හේතුවිය හැකි කරුණු මොනවා ද?
(vi) ඔවුන්ගේ නිවසෙහි නිදන කාමරයක ජනේල තිරරෙදි සඳහා රෙදි තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(vii) මොවුන්ගේ විසිත්ත කාමරයෙහි තබා ඇති රවුම් හැඩැති කුෂන් එක සඳහා යොදන කුෂන් කවරයට සුදුසු මෝස්තරයක් අඳින්න.
(viii) විකර්ණාකාර පටි භාවිත කර, මෙම කුෂන් කවරයෙහි අද්දර නිම කරන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(ix) යොවුන් වියෙහි පසුවන දරුවන්ගේ කායික වර්ධනයේ දී පෙන්වන සුවිශේෂී ලක්ෂණ **දෙකක්** ලියන්න.
(x) යොවුන් දියණියගේ රූකවරණය සැලසීම සඳහා මව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**01.** (i)
- පවුලේ සාමාජිකයන්ගේ පෝෂණ අවශ්‍යතා
- වාරයේදී තිබෙන ආහාර ඇතුළත් කිරීම/ප්‍රාදේශීය වශයෙන් සුලබ/ පළාතෙන් ලබා ගැනීමේ පහසුව
- පෝෂ්‍යදායි ආහාර ඇතුලත් කිරීම.
- පවුලේ සාමාජිකයන්ගේ රුචි අරුචිකම්.
- පෝෂණය රැකෙන අයුරින් ආහාර සකස් කිරීම.
- විවිධත්වයකින් යුතු ආහාර වේල් සකස් කිරීම.
- ස්වාභාවික ආහාර ඇතුළත් කිරීම. **(කරුණු 02 ට ලකුණු 02යි)**

(ii)
- ප්‍රෝටීන්
- කැල්සියම්
- ශක්තිය ජනක ආහාර
- ෆොස්ෆරස්
- යකඩ
- විටමින් A
- සින්ක්
- B කාණ්ඩයේ විටමින් වර්ග **(කරුණු 04ට ලකුණු 02යි)**

(iii) ● ඉක්මනින් නරක් නොවන ආහාර ඇතුළත් කිරීම.
● පරිරක්ෂිත ආහාර ඇතුළත් කිරීම.
● දියරමය බවින් අඩුවන ලෙස ආහාර සකස් කිරීම/ගෙනයාමේ පහසුව.
● ප්‍රිය උපදවන ලෙස විවිධත්වයෙන් යුතු ආහාර සකස් කිරීම.
● ඉක්මනින් සකස් කරගත හැකි ආහාර ඇතුළත් කිරීම.

**(කරුණු 02ට ලකුණු 02යි)**

(iv) ● ක්ෂණික ආහාරවලට ඇබ්බැහි නොවීම.
● පිටතින් ආහාර ගැනීමෙන් බොහෝ දුරට වැලකී සිටීම.
● ආහාර තෝරා ගැනීමේ දී පෝෂණය පිළිබඳ අවබෝධයකින් කටයුතු කිරීම.
● වෙළඳ ප්‍රචාරණවලට හසු නොවී සුදුසු ආහාර තෝරා ගැනීම.
● ප්‍රධාන ආහාර වේල්වලට බාධා කරන නිශ්චිල ආහාර නොගැනීම.
● ප්‍රධාන ආහාර වේල් මග නොහැරීම/නියමිත වේලාවට ආහාර ගැනීම.
● ප්‍රධාන ආහාර වේල් අතරමැද ආහාර නොගැනීම.

**(කරුණු 04ට ලකුණු 02යි)**

(v) ● සාමාජිකයින්ගේ අවශ්‍යතා ඉටු වීම.
 * මානසික
 - ආදරය, සෙනෙහස, බැඳීම, විශ්වාසය.
 - අන්‍යෝන්‍ය සුහදතාව
 - රැකවරණය
 - සහයෝගයෙන් කටයුතු කිරීම
 * කායික
 - පෝෂණ තත්වය
 - සෞඛ්‍ය තත්වය
 * භෞතික
 - ශ්‍රම විභජනය
 - සකසුරුවම්කම (මුදල්, භාණ්ඩ යනාදිය)
 - ආරක්ෂිත පරිසරයක් තිබීම

**(කරුණු 02ට ලකුණු 02යි)**

(vi) ● ලා පැහැයෙන් යුක්ත වීම.
● විනිවිද පෙනෙන සුළු නොවීම.
● සරල මෝස්තරයකින් යුක්ත වීම.
● බිත්ති සහ පසුතල වර්ණ වලට ගැලපීම.

**(කරුණු 02ට ලකුණු 02යි)**

(vii) ● රවුම් හැඩැති කුෂන් කවරයෙහි අද්දරට හෝ මැදට සුදුසු මෝස්තරයක්.

**(මෝස්තරයට ලකුණු 02යි)**

(viii) ● පයිපින් කිරීම.
● බයින්ඩින් කිරීම.
● අද්දර නිම කරන ලද විකර්ණකාර පටියක් රැළි කර ඇල්ලීම.

**(ක්‍රම දෙකකට ලකුණු 02යි)**

(ix) ● ද්විතියික ලිංගික ලක්ෂණ පෙන්වීම.(කට හඬ වෙනස්වීම්, රෝම ඇති වීම්, උකුල පළල්වීම, උරහිස් පළල් වීම යනාදිය)
- වර්ධනයේ සීඝ්‍රතාව.(උස හා බර)
- අස්ථි ඝනත්වය ඇති වීම.
- සිරුරේ හැඩය වෙනස් වීම.
- ගැහැණු දරුවන්ගේ මේද පටක වර්ධනය
- පිරිමි ළමුන්ගේ පේශි පටක වර්ධනය

**(කරුණු 02ට ලකුණු 02යි)**

(x) ● දියණියට නිසි ඔවදන් ලබා දීම.
- සමාජය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීම.
- මානසික අවශ්‍යතා පිළිබඳ දියණිය සමග සාකච්ඡා කිරීම හා අවශ්‍ය පිළියම් යෙදීම.
- දියණිය සමග යෙහෙළියක් සේ ජීවත් වීම.
- දියණිය ඇසුරුකරන්නන් පිළිබඳව සැළකිලිමත් වීම.
- ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳව උපදෙස් ලබා දීම.
- පිටත යන විට අවශ්‍ය නම් දරුවා සමඟ යාමට තමා සහභාගි වීම.

**(කරුණු 02ට ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

**01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




01 ප්‍රශ්නය අනිවාර්ය වේ. පිළිතුරු සැපයීම 100% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 6%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 11 - 12 ප්‍රාන්තරයේ 49%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14% ක් වන අතර 6% ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් 10 අතරින් පහසුතාව 72% ට වඩා වැඩි කොටස් 3 කි. පහසුතාව වැඩිම කොටස (vii) වේ. එහි පහසුතාව 83% ට අඩුය. පහසුතාව අඩුම කොටස (viii) වේ. එහි පහසුතාව 20% කි.

1 ප්‍රශ්නය (අනිවාර්ය) තෝරාගෙන ඇති ප්‍රතිශතය 100%කි. 20%ක අඩුම පහසුතාව දක්වා ඇත්තේ (viii) කොටසටය. රෙදිපිළි තාක්ෂණය ක්ෂේත්‍රයට අයත් විකර්ණාකාර පටි භාවිත කර අද්දර නිම කරන ක්‍රම භාවිත කිරීමේ දැනුම සහ හැකියාව සිසුන් තුළ නොමැතිවීම මෙයට හේතු වේ. පංති කාමරය තුළ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම මගින් අවශ්‍ය දැනුම ලබා දීමට හැකිවේ. එමෙන්ම දෘෂ්‍යාධාර භාවිතයෙන් සහ ආදර්ශනයෙන් ළමුන් තුළ දැනුම තහවුරු කළ හැකිය.

(iv) වන කොටසෙහි පහසුතාව 22%ක් වේ. මෙහිදී ප්‍රශ්ණයේ මූලික කඳ කොටස පිළිබඳව අවධානයෙන් තොරව පිළිතුරු සැපයීමට යොමු වීම නිසා නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන්ට නොහැකි වී තිබුණි. ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට ළමුන් දැනුවත් කළ යුතුය.

**2 ප්‍රශ්නය**

**2.** **පහත රූප සටහනෙන් දැක්වෙන්නේ මුල් ළමාවියෙහි දරුවකු සඳහා නිර්මාණය කරන ලද ගවුමකි.**



**(i) මෙම ළමා ගවුම විසිතුරු කිරීමට යොදා ගත හැකි ක්‍රම තුනක් දක්වන්න.**

**(ii) මෙහි සාය කොටස කඳට ඇල්ලීම සඳහා සකස් කිරීමේ දී අනුගමනය කරන පියවර ලියන්න.**

**(iii) මෙම රූපයෙහි ළමා ගවුම සඳහා ඉහළට පමණක් රැළි සහිත බෝරිච්චි අත් පන්නයක් යොදා ඇත. එම අත් පන්නය සඳහා පතරොම නිර්මාණය කිරීමේ දී අනුගමනය කරන පියවර රූප සටහන් ඇසුරින් පෙන්වන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**02** (i)
- රිබන් ඇල්ලීම,බ්‍රේඩින් ඇල්ලීම
- සික්වීන්ස්, පබලු මෝස්තර,බොත්තම් ඇල්ලීම.
- එම්බ්‍රොයිඩර් කිරීම.
- බෝ ඇල්ලීම.
- ආරෝපණය කිරීම.
- පින්තාරු කිරීම.
- රේන්ද ඇල්ලීම. (ලේස්)
- මල් මැසීම.

**(ක්‍රම 03ට ලකුණු 03යි)**

(ii)
- සායේ අංශ මුට්ටු කිරීම.
- හීන් නූල් දුවවා සාය රැලි කිරීම.
- කඳෙහි සහ සායෙහි අංශ එක් රේඛාවක පිහිටන සේ අල්පෙනෙති ගැසීම.
- කඳෙහි ඉනට සම වන ලෙස සායෙහි රැලි සකස් කිරීම.

**(ලකුණු 03යි)**

(iii)



(1) (2)

(රූප සටහන් දෙකට ලකුණු 04)
(මුළු ලකුණු 10)

**02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




02 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 33 % කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 57 % ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 30 % ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 8 % ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 5% ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 5 % ක් වන අතර 57 % ක් ලබාගෙන ඇත්තේ ලකුණු 2 ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 03 අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වන අතර එහි පහසුතාව 52 % කි. එසේම පහසුතාව අඩු ම කොටස (ii) වන අතර එහි පහසුතාව 12 % කි.

| |
|---|
| (ii) කොටස සඳහා පහසුතාව 12 %කි. ළමා ගවුම නිර්මාණයේදී නිවැරදි ව, පියවර ලෙස ඉදිරිපත් කිරීම නොහැකි බව පැහැදිලි විය. මෙය සාය කොටස කඳට ඇල්ලීම සඳහා සකස් කිරීම යන්න නිවැරදිව අවබෝධ කරගෙන නොතිබුණි. සිසුන් ප්‍රායෝගිකව යෙදවීම සහ ගුරු ආදර්ශණය මගින් පියවරින් පියවර පැහැදිලි කර සටහන් කිරීමට මග පෙන්විය යුතුය. |

3 ප්‍රශ්නය

**3.** (i) ශීතකරණය තුළ ආහාර ගබඩා කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු තුනක් දක්වන්න.

(ii) පහත දක්වා ඇත්තේ ආහාර සහ පෝෂණයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිහිපයක දී සිසුන්ට මුහුණපෑමට සිදුවූ ගැටලු තුනකි. ඒ එක් එක් ගැටලුව ඇතිවීමට හේතු විය හැකි කරුණු සඳහන් කරන්න.

(a) කට්ලට් බැදීමේ දී විසිරී යාම

(b) පලතුරු සලාදයෙහි කෙසෙල් කැබලි දුඹුරු පැහැ ගැන්වීම

(c) කිරිටොෆි සන නොවීම

(iii) දරුවකුට පාසලට ගෙනයාම සඳහා සැමන් සැන්ඩ්විච්ස් සහ අඹ බීම සකස් කර දෙන ලද.

(a) සැමන් සැන්ඩ්විච්ස්වලට අදාළව දී ඇති වගුවෙහි කරුණු ගොනුකර දක්වන්න.

| ආහාරයේ අන්තර්ගත ආහාර ද්‍රව්‍ය | මහා පෝෂකය | සංයුතියෙහි අඩංගු මූලද්‍රව්‍ය | ජීරණයෙහි අවසාන ඵල |
|---|---|---|---|
| ● පාන් | | | ග්ලූකෝස් |
| ● සැමන් | | C, H, O, N | |
| ● බටර් | මේදය | | |

(b) ඉහත ආහාර වේලෙහි අඹ බීම අඩංගු කිරීමේ වැදගත්කම ලියන්න.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**03** (i)

- මස් මාළු වැනි දෑ අධි ශීතකරණයේ ගබඩා කිරීම.
- කුඩා කොටස් වශයෙන් තැන්පත් කිරීම.
- වායු සංසරණයට බාධා ඇතිනොවන සේ තැන්පත් කිරීම.
- පමණට වඩා ආහාර තැන්පත් නොකිරීම.
- උණුසුම් ආහාර නිවුන පසු තැන්පත් කිරීම.
- එළවළු ගබඩා කිරීමේ දී සිදුරු සහිත පොලිතින් ආවරණ තුළ බහා තැන්පත් කිරීම. (සුදු කඩදාසි රිපිෆෝම්, පෙට්ටි)
- පිසින ලද ආහාර වසා තැබීම.
- ඒ ඒ ආහාරවලට සුදුසු උෂ්ණත්ව පරාස වල ගබඩා කිරීම.
  උදා: ( එළවළු - පහළම ඇති අසුරණයේ, බිත්තර - දොරෙහි ඉහළ කොටසේ)

(කරුණු 03ට ලකුණු 03යි)

(ii) (a)

- කට්ලට් මිශ්‍රණය සඳහා ගන්නා අමුද්‍රව්‍ය සිහින්ව කපා නොතිබීම.
- අඩු උෂ්ණත්වයේ බැද ගැනීම.
- තෙල් අවශ්‍ය උෂ්ණත්වයට රත්වීමට පෙර බැද ගැනීම.
- බැදීමට ගන්නා තෙල් ප්‍රමාණවත් නොවීම.
- තෙල් හැන්දෙන් නිතර නිතර මිශ්‍ර කිරීම.
- කට්ලට් මිශ්‍රණය හොඳින් තද නොවීම.

(කරුණු 02ට ලකුණු 01යි)

(b)

- එන්සයිමීය ප්‍රතික්‍රියා ඇතිවීම.
- පළමුවෙන්ම කෙසෙල් කපා ගැනීම.
- කෙසෙල් දුඹුරු පැහැ ගැන්වීම වැළැක්වීම සඳහා දෙහි යුෂ එක් නොකිරීම.
- පිළිගැන්වීමට බොහෝ වේලාවකට පෙර කෙසෙල් කපා තැබීම.

(කරුණු 02 ට ලකුණු 01)

(c)

- අමුද්‍රව්‍ය නියමිත අනුපාතයට නොගැනීම.
- සීනි ප්‍රමාණය අඩු වීම.
- තාපය නිසි ලෙස පාලනය නොකිරීම.
- පදම ඒමට පෙර ලිපෙන් බා ගැනීම.

(කරුණු 02 ට ලකුණු 01)

(iii) (a)

| ආහාරයේ අන්තර්ගත ආහාර ද්‍රව්‍ය | මහා පෝෂකය | සංයුතියෙහි අඩංගු මූල ද්‍රව්‍ය | ජීර්ණයෙහි අවසාන ඵල |
|---|---|---|---|
| • පාන් | • කාබොහයිඩ්‍රේට් | • C, H, O | • ග්ලූකෝස් |
| • සැමන් | • ප්‍රෝටීන් | • C, H, O,N | • ඇමයිනෝ අම්ල |
| • බටර් | • මේදය | • C, H, O | • මේද අම්ල හා ග්ලිසරෝල් |

(කරුණු 06 ට ලකුණු 03)

(b)
- බීටා කැරොටීන් (විටමින් A)
- තන්තු අඩංගු වීම නිසා මල බද්ධය වැළැකීම.
- ශක්තිය ලබා දීම (කැලරි අගය වැඩි වීම)
- විටමින් C

(කරුණු 02 ට ලකුණු 01)

(මුළු ලකුණු 10)

**03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




03 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 66%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 18%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 17% ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 17%ක් වන අතර,18%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 2ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 3 අතුරෙන් පහසුතාව වැඩි ම අනුකොටස (iii) (a) වන අතර එහි පහසුතාව 99%කි. එසේම පහසුතාව අඩු ම අනුකොටස (iii) (b) වන අතර එහි පහසුතාව 17 % කි.

II පත්‍රයේ 3 වෙනි ප්‍රශ්නයට අදාල (iii) (a) අනුකොටස සඳහා වැඩිම පහසුතාවක් දක්වා ඇත. එය 99% කි. මහා පෝෂක පිළිබඳ දැනුම ළමුන් තුළ හොඳින් තහවුරු වී ඇති බව පැහැදිලි වේ. එසේ වුවත් එම ප්‍රශ්නයේ (b) අනු කොටසෙහි අඹ බීම අඩංගු කිරීමේ වැදගත්කම පිළිබඳ ව නොදන්නා බැවින් එහි පහසුතාව 17% දක්වා අඩු වී ඇත. පළතුරුවල පෝෂණමය වැදගත්කම මැනවින් වටහා දීම කළ යුතුය. සමස්තයක් වශයෙන් ගත්විට 3 වෙනි ප්‍රශ්නයෙහි (iii) (b) හැර ඉතිරි අනු කොටස් සඳහා 35% ට වැඩි පහසුතාවක් දක්වා ඇත.

4. (i) සත්ත්ව හා ශාක මේද අතර ඇති වෙනස්කම් දක්වන්න.
(ii) මේදවලින් සිරුරට ඉටු වන කෘත්‍ය තුනක් සඳහන් කරන්න.
(iii) විනාකිරි භාවිත කර පරිරක්ෂණය කරනු ලබන ආහාර වර්ග දෙකක් නම් කරන්න. ඉන් එකක් සැකසීමේ දී අනුගමනය කරනු ලබන පියවර ගැලීම් සටහනක් ඇසුරින් දක්වන්න.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**04** (i)

| සත්ත්ව මේද | ශාක මේද |
|---|---|
| ● කාමර උෂ්ණත්වයේ දී ඝණ ලෙස පවතියි.<br>● සංතෘප්ත මේද අම්ල බහුල වේ.<br>● මාළුවල ඔමේගා 3 මේද අම්ල අඩංගු වේ.<br>● කොලෙස්ටරෝල් අඩංගු විය හැකිය. | ● කාමර උෂ්ණත්වයේ දී ද්‍රව ලෙස පවතියි.<br>● අසංතෘප්ත මේද අම්ල අඩංගු වේ.<br>● ලිනොලෙයික් හා ලිනොලෙනික් යන අසංතෘප්ත මේද අම්ල අඩංගු වේ.<br>● කොලෙස්ටරෝල් අඩංගු නොවේ. |

(කරුණු 03 ට ලකුණු 03)

(ii)
- ශරීරයට ශක්තිය සැපයීම. මේද ග්‍රෑම් 01 කින් කිලෝ කැලරි 09 ක් (කිලෝ ජූල් 38 ක්) සැපයීම.
- මේද ද්‍රාව්‍ය විටමින් (විටමින් A, D, E, K ) සිරුරට අවශෝෂණය කර ගැනීමට උපකාරී වීම.
- ශරීරයට හිතකර අත්‍යවශ්‍ය මේද අම්ල ලබා දීම.
  උදා : ලිනොලෙයික් අම්ලය, ලිනොලෙනික් අම්ලය.
- ශරීරයෙහි අභ්‍යන්තර ඉන්ද්‍රියයන් වටා ඇති මේද ස්ථර මගින් එම ඉන්ද්‍රියයන්ට ආරක්ෂාව සැපයීම.
- ස්නේහකයක් වශයෙන් ක්‍රියා කිරීම.
- සමට යටින් තැන්පත් වී ඇති මේද ස්තරය මගින් ශරීර උෂ්ණත්වය පවත්වා ගැනීම.
- මොළය හා කපාලය අතර ඇති ඝණ මේද ස්තරය මගින් කම්පන අවශෝෂණය කිරීම.
- කොලෙස්ටරෝල්, පිත් යුෂ නිපදවීමට අවශ්‍ය වීම. (කරුණු 03 ට ලකුණු 03)

(iii) ● අච්චාරු, සෝස්, චට්නි (මින් දෙකක් නම් කිරීමට ලකුණු 01)

<u>අච්චාරු සෑදීම</u>

ලූණු, අමුමිරිස්, ගස්ලබු පිරිසිදු කිරීම
↓
තෙතමනය ඉවත් කිරීම
↓
ගස්ලබු සිහින්ව කපා ගැනීම
↓
අබ විනාකිරිවලින් ඇඹරීම
↓
ඉගුරු, සුදු ලූණු අඹරා ගැනීම
↓
විනාකිරි ලිප තැබීම
↓
ලූණු, අමු මිරිස් හා ගස්ලබු මඳ වේලාවක් තැම්බීම
↓
අඹරාගත් ද්‍රව්‍ය මිශ්‍ර කිරීම
↓
සුළු වේලාවක් මඳ ගින්නේ තැම්බීම
↓
නිවෙන්නට තැබීම
↓
ඇසුරුම් කිරීම

**චට්නි සෑදීම**

පැසුණු පළතුරු තේරීම

↓

සේදීම

↓

පොත්ත ඉවත් කර කැබලි කිරීම.

↓

මඳ ගින්නේ හැඳි ගාමින් පිසීම (කැබලි ඝණව තිබේ නම් මුලින්ම ඝණ කැබලි එකතු කර සිහින් කැබලි පසුව එකතු කරමින් පිසීම)

↓

උකුවන තෙක් හැඳි ගෑම

↓

විනාකිරෙන් අඹරාගත් සුදු ලූණු, අමු ඉඟුරු සහ කුළු බඩු (මිරිස් කුඩු, කුරුඳු පොතු) සහ සීනි එකතු කිරීම

↓

හොඳින් මිශ්‍ර කිරීම

↓

පදම ආපසු උදුනෙන් ඉවතට ගැනීම

↓

නිවෙන්නට තබා ඇසුරුම් කිරීම

**සෝස් සෑදීම**

තේරීම

↓

සේදීම

↓

බ්ලාන්ච් කිරීම

↓

පොත්ත ඉවත් කිරීම

↓

පොඩි කර ඇට ඉවත් කර පෙරා ගැනීම

↓

ඉඟුරු, සුදු ලූණු විනාකිරෙන් අඹරා ගැනීම

↓

විනාකිරි මඳගින්නේ රත් කර එයට සීනි, අඹරාගත් සුදු ලූණු, ඉඟුරු හා ලුණු එකතු කිරීම

↓

පෙරා ගත් පල්පය එකතු කිරීම

↓

පදමට ආපසු උදුනෙන් ඉවතට ගැනීම

↓

නිවෙන්නට තබා ඇසුරුම් කිරීම

**(එක් සටහනකට ලකුණු 04)**
**(මුළු ලකුණු 10 යි)**

04  ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




04 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 58%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

| | | | | |
|---|---|---|---|---|
| ඉන් | ලකුණු | 00 - 02 | ප්‍රාන්තරයේ | 41%ක් ද |
| | ලකුණු | 03 - 05 | ප්‍රාන්තරයේ | 42%ක් ද |
| | ලකුණු | 06 - 07 | ප්‍රාන්තරයේ | 13%ක් ද |
| | ලකුණු | 08 - 10 | ප්‍රාන්තරයේ | 4%ක් ද |

ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 4%ක් වන අතර ලකුණු 2 ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 41% කි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 3 අතුරෙන් පහසුතාව වැඩි ම (ii) හා (iii) කොටස් වන අතර එහි පහසුතාව 43% බැගින් වේ. එසේම පහසුතාව අඩුම කොටස (i) වන අතර එහි පහසුතාව 10% කි.

4 වන ප්‍රශ්නයේ (i) කොටස සඳහා අඩුම පහසුතාවක් දක්වා ඇත. එය 10% කි. සත්ව මේද සහ ශාක මේද අතර වෙනස්කම් හොඳින් අවබෝධ කරගෙන නැති බව පැහැදිලි විය. (i) සහ (ii) කොටස් සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය දැනුම වර්ධනය කර ගැනීම සඳහා පෙළපොත පරිශීලනය සහ වැඩිදුර දැනුම සෙවීමට උනන්දු කරවීම වැදගත් වේ.

**5 ප්‍රශ්නය**

(i) ගෘහීය සම්පත් කළමනාකරණය තුළින් සැලසෙන වාසි හතරක් සඳහන් කරන්න.

(ii) ගෘහීය අයවැය ලේඛනයක, ආදායම් මාර්ග, වියදම් ශීර්ෂ හා ඉතිරි කිරීම් ඇතුළත් කර ඇත. මේ එකිනෙකට උදාහරණ දෙක බැගින් ලියන්න.

(iii) නිල්, නිල් කොළ, කොළ යන බද්ධ වර්ණ භාවිතයෙන් කාමරයක් අලංකාර කර ගන්නා අයුරු පැහැදිලි කරන්න.

**05 අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) ● පවුලේ අවශ්‍යතා හා අපේක්ෂණා ඉටු කර ගැනීමට හැකිවීම.

● පවුලේ සාමාජිකයින්ට මානසික සුවයක් ලැබීමෙන් තෘප්තිමත් වීම.

● අන්‍යොන්‍ය අවබෝධය ඇතිවීම.

● පවුලේ සමගිය, සහයෝගිතාව ඇති වීම.

● පවුලේ අභිවෘද්ධියට මග පෑදීම.

● කාලය කලමනාකරණය වීම තුළින් ප්‍රයෝජනවත් දේ කල හැකි වීම.

(කරුණු 03 ට ලකුණු 03)

(ii) ●ආදායම් මාර්ග.

* මුදල් හෙවත් මූල්‍ය ආදායම

උදා : වැටුප්, පොළී, බදු කුළී.

(උදාහරණ 02 ට ලකුණු 01)

● වියදම් ශීර්ෂ

* අත්‍යවශ්‍ය වියදම්

- වාසස්ථාන සඳහා වියදම්

උදා : ගෙවල් කුලී/ වරිපනම් බදු

- ආහාර පාන සඳහා වියදම්
- ඇඳුම් පැළඳුම් සඳහා වියදම්
- අධ්‍යාපන කටයුතු සඳහා වියදම්
- ප්‍රවාහන වියදම්

* අතිරේක වියදම්

- විනෝද කටයුතු
- විශේෂ උත්සව
- හදිසි විපත්
- රෝගාබාධ සඳහා

(උදාහරණ 02 ට ලකුණු 01)

● ඉතිරි කිරීම්

* බැංකු ගිණුම්

උදා : ඉතිරි කිරීමේ ගිණුම්

ස්ථාවර තැන්පතු

උපයාගත් විට ඉතිරි කිරීම්

ඉතුරුම් වාසනා පත්

* සීට්ටු

* කොටස් මිලදී ගැනීම්

(උදාහරණ 02 ට ලකුණු 01)

(කරුණු 06 ට ලකුණු 03)

(iii) ● සිවිලිම

● බිත්ති.

● බිම.

● ගෘහ භාණ්ඩ .

● තිරරෙදි යනාදියට මෙම වර්ණ විවිධ අගයයන් හා තීව්‍රතාවයෙන් සුදුසු ලෙස යොදා ගත යුතු ය. උදාසීන වර්ණද ඇතුළත් කළ යුතුය.

(කරුණු 04 ට ලකුණු 04)

(මුළු ලකුණු 10 යි)

05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




05 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 78 %කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 19 % ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 33 % ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 24 % ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 24 % ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 24 % ක් වන අතර, 19 %ක් ලබාගෙන ඇත්තේ ලකුණු 2 ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 3 අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වන අතර එහි පහසුතාව 60 %කි. එසේම පහසුතාව අඩු ම කොටස (iii) වන අතර එහි පහසුතාව 53 % කි.

5 වෙනි ප්‍රශ්නයේ කොටස් 3 සඳහා 50 %ට වැඩි පහසුතාවක් දක්වා ඇත.ගෘහ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ මෙම ප්‍රශ්නයෙහි (i) හා (ii) කොටස් සඳහා 60 % හා 59 % ක් ලබා තිබුණු අතර (iii) කොටස සඳහා 53 % ක් ලබා ඇත.වර්ණ ගැලපීම පිළිබඳ මීට වඩා දැනුමක් අවශ්‍ය අතර, ඒ සඳහා දෘෂ්‍යාධාර හා ආදර්ශණ උපයෝගී කර ගැනීමට යොමු වීම වැදගත්ය.

**6 ප්‍රශ්නය**

06 **(i) ගර්භිණීභාවයෙහි ලක්ෂණ තුනක් සඳහන් කරන්න.**
**(ii) වයස මාස 6-12 ළදරුවන් පෙන්වන චාලක හැකියා තුනක් ලියන්න.**
**(iii) පහත සඳහන් දෑ පිළිබඳ ව සටහන් ලියන්න.**
**(a) ඩිම්බමෝචනය**
**(b) එන්ඩොමෙට්‍රියම (අන්තඃජදය)**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

06 (i)
- ආර්තවය නැවතීම
- ආහාර අරුචිය
- උදරය විශාල වීම
- නිතර මුත්‍ර පිට කිරීමේ අවශ්‍යතාවය
- උදෑසන වමනය හා ඔක්කාරය

**(කරුණු 03 ට ලකුණු 03)**

(ii) ● උඩු අතට සිට මුනින් අතට හා මුනින් අතට සිට උඩු අතට හැරෙයි.
● බඩ ගෑම සිදු කරයි.
● දණ ගෑම සිදු කරයි.
● වෙනත් අයෙකුගේ උපකාර ඇතුව වාඩි වීමට හැකියාව ඇති වේ.
● පසු කාලයකදී තනිව වාඩි වේ.
● ක්‍රීඩා භාණ්ඩ දෙකක් එකට ගසමින් ක්‍රීඩා කරයි
● අන් අයගේ උදව් ඇතිව නැගිටියි. පසුව තනිව නැගිටියි.
● අන් අයගේ උපකාරයෙන් ඇවිදියි.
● තනිව ඇවිදිමට උත්සාහ කරයි.

**(කරුණු 03 ට ලකුණු 03)**

(iii) (a) ● ඩිම්බ මෝචනය

- පරිණත ඩිම්බයක් ඩිම්බකෝෂයකින් මුදා හැරීම. මෙම සිදු වීම දින 56 කට වරක් වම් හා දකුණු ඩිම්බකෝෂ වලින් මාරුවෙන් මාරුවට සිදුවේ. **(ලකුණු 02)**

(b) ● අන්තඃප්‍රදය

- ගර්භාෂයේ ඇතුළු ආස්තරය අන්තඃප්‍රදය (එන්ඩොමෙට්‍රියම) නම් වේ. සංසේචනය වීමත් සමඟ (යුක්තානුව) සෛල බෙදීම නිසා සෛල පොකුරක් ලෙස (මොරියුලාව) ගර්භාෂයට පැමිණ අන්තඃප්‍රදය තුළ ගිලී සවි වී කලලයෙහි වැඩීම ආරම්භ වේ.

**(ලකුණු 02)**
**(මුළු ලකුණු 10)**

## 06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




06 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 75 %කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉන් | ලකුණු | 00 | - | 02 | ප්‍රාන්තරයේ | 21% ක් ද |
| | ලකුණු | 03 | - | 05 | ප්‍රාන්තරයේ | 47% ක් ද |
| | ලකුණු | 06 | - | 07 | ප්‍රාන්තරයේ | 20% ක් ද |
| | ලකුණු | 08 | - | 10 | ප්‍රාන්තරයේ | 12% ක් ද |

ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 12 % ක් වන අතර,21 % ක් ලබාගෙන ඇත්තේ ලකුණු 2ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 3 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) වන අතර එහි පහසුතාව 76 %කි. එසේම පහසුතාව අඩු ම කොටස (iii) (b) වන අතර එහි පහසුතාව 18 %කි.

(i) කොටස සඳහා 76 % ක ඉහළ පහසුතාවක් දක්වා ඇත. (ii) කොටස සඳහා 57 % ක් ද (iii) වන කොටසෙහි (a) සඳහා 33 % ක් සහ (b) සඳහා 18 %ක පහසුතාවක් දක්වා ඇත. (iii) කොටස සඳහා පිළිතුරු පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති බවයි. භාවිතවන විද්‍යාත්මක යෙදුම් පිළිබඳ මනා දැනුමක් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ලබා දිය යුතු අතර ඉගැන්වීම් සඳහා දෘෂ්‍යාධාර උපයෝගී කර ගැනීම ද වඩාත් යෝග්‍ය වේ.

**7 ප්‍රශ්නය**

07 **(i) ලිංගික සම්ප්‍රේෂණ ආසාදන තුනක් නම් කරන්න.**

**(ii) යෞවුන්වියෙහි දරුවන්ගේ මානසික වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ තුනක් ලියන්න.**

**(iii) "යෞවුන්වියෙහි දරුවකුගේ සංවර්ධනය කෙරෙහි සමවයස් කණ්ඩායම වැදගත් වේ." මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා කරුණු හතරක් ඉදිරිපත් කරන්න.**

07 **අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i)
- හර්පීස් සිම්ප්ලෙක්ස්
- සුදු බිංදුම (ගොනෝරියා)
- ක්ලැමීඩියා
- සුදු බිංදුම නොවන මුත්‍රා ප්‍රදාහය
- ට්‍රයිකොමොනයසීස් ආසාදනය
- HIV/ AIDS
- ලිංගික ඉන්නන්
- උපදංශය (සිෆිලිස්)

**(කරුණු 03 ට ලකුණු 03)**

(ii)
- ගැටලු විසඳීමේ හැකියාව
- තර්කානුකුල චින්තනය
- නිර්මාණශීලිබව
- නිරවුල්ව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව
- ප්‍රතිඵල ගැන සිතා තීරණ ගැනීමේ හැකියාව
- නායකත්ව දැරීමට ඇති හැකියාව
- අවස්ථාචෝචිතව හැසිරීමේ හැකියාව
- නිරීක්ෂණ හැකියාව
- ස්මරණ හැකියාව
- සංජානන හැකියාව
- පරිකල්පනය

මානසික වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ වේ **(කරුණු 03 ට ලකුණු 03)**

(iii)
- සම වයස් කණ්ඩායම් වල ඇසුර නිසා සමාජ වර්ධනය සීඝ්‍ර වේ. එනම් කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීමේ හැකියාව ඇති වේ.
- ආත්ම කේන්ද්‍රිය භාවයෙන් මිදී අන්‍යයන් සමග සබඳතා ඇති කර ගැනීම. එම නිසා යොවුන් විය අවසානයේ දී සමාජය පිළිගන්නා හැසිරීම් රටාවක් ඇති කර ගනියි.
- අන්‍යයන්ගේ අදහස්වලට ගරු කිරීමට, ඉවසීමට හැකිවේ.
- නායකත්වය ගැනීමට යොමුවේ.
- නම්‍යශීලි බව පිළිබිඹු කරයි.
- ස්වාධීනව කටයුතු කිරීමට හැකියාව ලබා ගනියි.
- අදහස් හුවමාරු කර ගැනීමෙන් ගැටළු විසඳා ගැනීමට අවස්ථාව සැලසේ.
- නිර්මාණශීලී බව ඇතිකර ගැනීමට හේතුවේ.
- අභියෝග ජය ගැනීමට හුරුව ලබයි.

**(කරුණු 04 ට ලකුණු 04)**

**(මුළු ලකුණු 10 යි)**

## 07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 86% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 16 % ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 33 % ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 26 % ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 25 % ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 25% ක් වන අතර, 16 % ක් ලබාගෙන ඇත්තේ ලකුණු 2ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 3 අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වන අතර එහි පහසුතාව 80 % කි. එසේම පහසුතාව අඩු ම කොටස (ii) වන අතර එහි පහසුතාව 42 %කි.

7 වන ප්‍රශ්නයෙහි (i) කොටස සඳහා 80%ක ඉහළ පහසුතාවක් දක්වා ඇත. (ii) කොටස සඳහා 42 %ක පහසුතාවක් දක්වා ඇති අතර 56% ක පහසුතාවක් (iii) කොටස සඳහා දක්වා ඇත. යොවුන් වියෙහි දරුවන්ගේ මානසික වර්ධනයෙහි සුවිශේෂී ලක්ෂණ වෙන්කර හඳුනා ගැනීමට අසමත් වී ඇති බව දක්නට ලැබුණි. එක් එක් වර්ධනයන් පිළිබඳව සුවිශේෂී ව ඉගැන්වීම මගින් පැහැදිලි අවබෝධයක් ලබා දිය හැකිය.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :







II පත්‍රයට අදාළ ක්ෂේත්‍ර හතරින් වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවකට පහසු වී ඇත්තේ ගෘහ කළමනාකරණය ආශ්‍රිත ප්‍රශ්න වේ. එහි පහසුව 61 %කි. ආහාර හා පෝෂණය ආශ්‍රිත ප්‍රශ්න සඳහා පහසුතාව 50 % වන අතර ළමා සංවර්ධනය ආශ්‍රිත ප්‍රශ්න සඳහා 58 % පහසුතාවක් දක්වා ඇත. රෙදිපිළි තාක්ෂණය ආශ්‍රිත ප්‍රශ්න සඳහා 24 % පහසුතාවක් දක්වා ඇත.

## III කොටස

3 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

I පත්‍රය

★ I පත්‍රයට පිළිතුරු සැපයීමේදී ප්‍රශ්නයෙන් අසා ඇති දේ නිවැරදි ව අවබෝධ කර ගැනීම.
★ ප්‍රශ්නයට ගැළපෙන වඩාත්ම නිවැරදි වරණය තෝරා ගැනීමේදී, තර්කාණුකූලව සිතා බැලීම තුළින් ප්‍රතිකර්ශක (නොගැළපෙන වරණ) හඳුනාගැනීම.
★ එක් වරණයක් පමණක් තෝරා සටහන් කිරීම.

II පත්‍රය

★ සිද්ධියක් ඇසුරින් ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවකදී එය කියවා පැහැදිලිව අවබෝධ කර ගැනීම.

★ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේදී යොදා ඇති ක්‍රියාපදය පිළිබඳව විමසිලිමත් වීම.
උදා - සඳහන් කරන්න
- හඳුන්වන්න
- විස්තර කරන්න
- අර්ථ දක්වන්න
ඒ අනුව පිළිතුරු සංවිධානය කර ගැනීම.
★ පිළිතුරු ලිවීමේදී ප්‍රකාශන ශක්තිය පිළිබිඹු වන ආකාරයට ඉදිරිපත් කිරීම.
★ - විස්තර කිරීමේදී ජේද වෙන් කිරීම.
- කරුණු ඉදිරිපත් කිරීමේදී කරුණු වෙන් වෙන් ව දැක්වීම.
- රූපසටහන් අවශ්‍ය තැන්හිදී, නම් කරන ලද රූප සටහන් ඉදිරිපත් කිරීම.
- රූපසටහන් ඇඳීම සඳහා පැන්සල භාවිතා කිරීම.
★ තාක්ෂණික යෙදුම් (Technical terms) නිවැරදිව භාවිත කිරීම.
★ පිළිතුරු ලිවීමේදී ප්‍රශ්න අංක සහ ඒවායේ අනු කොටස් නිවැරදිව දැක්වීම.
★ ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේදී කාලය පිළිබඳ සැලකිලිමත් වීම.
★ ප්‍රශ්නයෙන් අසා ඇති කරුණු ප්‍රමාණවත්ව ඉදිරිපත් කිරීම.
★ එකම කරුණ නැවත නැවතත් ලිවීමෙන් වැළකීම.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

- ★ ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය හා නිර්දිෂ්ඨ ග්‍රන්ථ ඇසුරු කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම.
- ★ ඉගෙනුම් අවස්ථාවට / විෂය අන්තර්ගතයට අදාල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතා කිරීම.
- ★ ඉගෙනුම් අත්දැකීම් ලබා දීමේදී උචිත ඉගෙනුම් උපකරණ භාවිත කිරීම.
- ★ ගවේෂණය සඳහා සිසුන්ට අවස්ථා සලසමින් ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම.
- ★ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මනාව සැලසුම් කර, පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීම.
- ★ රෙදිපිළි තාක්ෂණය විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රායෝගික කුසලතා ප්‍රගුණ කිරීමට එලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කිරීම.
- ★ ගුරු සිසු දෙපිරිසම ඉගෙනුමට සහ ඉගැන්වීමට යොමු වීම. එමගින් ඔවුන් යාවත්කාලීන වීම.
- ★ ක්‍රියාකාරකම් තුළ සිසුන් තක්සේරුකරණයට භාජනය කිරීමෙන් අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.
- ★ විවිධ වර්ගයේ බහුවරණ වණුවලට පිළිතුරු ලිවීමේ අභ්‍යාසවල යෙදවීම.
- ★ ව්‍යුහගත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
- ★ ගුරුවරුන් සේවාස්ථ සැසිවලට සහභාගි වීම.
- ★ ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් සහ විෂය අධ්‍යක්ෂවරුන් අතර සම්බන්ධතාව පවත්වාගැනීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව වර්ධනය කර ගැනීම.
- ★ පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියෙන් පසුව ද පෙළ පොත හොඳින් පරිහරණය කිරීමට දරුවන්ගේ විශේෂ අවධානය යොමු කරවීම.
- ★ ප්‍රශ්න පත්‍රවල ලකුණු දීමේ පටිපාටිය පරිශීලනය කරමින් ගුරු හා සිසු දැනුම වර්ධනය කර ගැනීම.

## 3.3 විදුහල්පතිවරුන් උදෙසා උපදෙස් :

★ විෂය සංවර්ධනය සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මගපෙන්වීම හා අනුග්‍රහය තව දුරටත් පුළුල් අයුරින් ලබා දිය යුතු ය.

★ විෂය සංවර්ධනය සඳහා අභ්‍යන්තර ඇගයීම් හා අධීක්ෂණ ක්‍රියාවලිය යාවත්කාලීනව සැලසුම් කර සංවිධානාත්මකව පවත්වාගෙන යා යුතු ය.

★ ගුරුවරුන්ගේ විෂය සංවර්ධනය සඳහා කොට්ඨාස, කලාප, පළාත් හා අමාත්‍යාංශ මට්ටමින් පවත්වන වැඩමුළු සඳහා සෑම ගුරුභවතකු ම සහභාගී කරවීමට කාරුණික විය යුතු ය.

★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

★ කාලසටහන් ලබා දීමේ දී විෂය ප්‍රවීණතාවය සහිත ගුරුභවතුන්ට මූලිකත්වය ලබා දීම අත්‍යාවශ්‍ය ය.

★ ගුරුභවතුන්ට තම විෂය පිළිබඳ වගකීම පැවරෙන පරිදි විෂය මාලාව ක්‍රියාත්මක කිරීම අවස්ථාව ලබාදීම. (එක් ශිෂ්‍ය කණ්ඩායමක් වසර කීපයක් එක් ගුරුභවතකුගේ විෂය භාරකාරත්වයට සම්බන්ධ කිරීම)

★ වාර්ෂිකව ත්‍යාග, සහතිකපත් ලබා දීම වැනි ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය තවදුරටත් යොමු කරවීම

★ ගෘහ ආර්ථික විද්‍යාව විෂය සංවර්ධනය සඳහා පාසලේ පවතින සම්පත්වලට ගැළපෙන පරිදි ස්ථානයක්, උපකරණ, ආශ්‍රිත ග්‍රන්ථ, ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට තවදුරටත් කරුණික විය යුතු ය.

★ විවිධ විෂයයන් සඳහා පුහුණුව හෝ පත්වීම් ලැබූ ගුරුභවතුන්ගේ කාල සටහන සම්පූර්ණ කිරීමේ අපේක්ෂාවෙන් ගෘහ ආර්ථ විද්‍යාව විෂය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් සඳහා යොමු නොකළ යුතු ය. එය විෂයට මෙන්ම සිසුන්ට ද කරන බලවත් හානියකි.

**විෂයභාර ගුරුභවතුන්ට උපදෙස් :**

★ අ.පො.ස.(සා.පෙළ) නියමිත විෂය නිර්දේශය ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.

★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරමින් එය ද ඉගෙනුම් උපකරණයක් වශයෙන් භාවිත කිරීමට වඩාත් අවධානය යොමු කරවීම.

★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ නිපුණතාවයන්ට හා විෂය සන්ධාරයට අදාළ යෝග්‍යතම ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගත යුතු ය.

★ හැකිතාක් දුරට ඉගෙනුම් ආධාරක තුළින් සංකල්ප සාධනයට අවස්ථා සලසා දිය යුතු ය.

★ අ.පො.ස.(සා.පෙළ) විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන **ශාඛාව මගින් සකස් කොට ඇති ඇගයීම් වාර්තා පරිශීලනය කොට එය විෂය සංවර්ධනය සඳහා යොදා ගත යුතු ය.**

★ **අඩු සාධන මට්ටම් පෙන්නුම්** කෙරෙන විෂය කොටස් සඳහා සාධන මට්ටම සංවර්ධනය කිරීමට විශේෂ වැඩමුළු, කඳවුරු, ව්‍යාපෘති, පැවරුම් වැනි ක්‍රියාකාරකම් යොදා ගත හැකිය.